## 5 වැනි පරිච්ඡේදය

# විදේශීය අංශයේ ප්‍රවනතා සහ ප්‍රතිපත්ති

### 5.1 සමස්ත විවරණය

2004 වසර තුළ ගෝලීය ආර්ථිකයෙහි ඇති වූ වර්ධනය සහ ජාත්‍යන්තර වෙළෙඳමෙහි වූ ප්‍රසාරණය ශ්‍රී ලංකාවේ විදේශීය අංශය කෙරෙහි වාසිදයක ලෙස බලපෑ නමුත් අනපේක්ෂිත බාහිර කම්පන මඟින් ඇති කරන ලද අභියෝගයන්ට මුහුණ දීමට ද රටට සිදුවිය. අපනයන සහ ආනයන දෙඅංශයෙහි ඇති වූ ඉහළ වර්ධනය හේතුවෙන් විදේශීය වෙළෙඳම සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. අපනයන පරිමාවේ ඇතිවූ සියයට 8 ක වර්ධනය සහ ඒකක මිල ගණන් සියයට 4 කින් ඉහළ යාමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපද (එ.ජ.) ඩොලර් වටිනාකම අනුව අපනයන ආදායම සියයට 12 කින් වර්ධනය වී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 5,757 දක්වා වැඩි වූ අතර, එය 2003 වසරේදී අත්කර ගත් සියයට 9 ක අපනයන වර්ධනය අභිබවා යාමකි. 2000 වසරින් පසුව වාර්තා වූ ඉහළම වාර්ෂික වර්ධනය මෙය වූ අතර, මෙම වර්ධනය සඳහා ඉහළ ගිය ජාත්‍යන්තර ඉල්ලුම හා අපනයන තරඟකාරිත්වයේ ඇති වූ වර්ධනය හේතු විය. 2003 වසරේ වූ සියයට 9 ක වර්ධනය හා සැසඳීමේදී, ආනයන පරිමාව සියයට 9 කින් සහ ඒකක වටිනාකම සියයට 10 කින් වර්ධනය වීම හේතුවෙන් ආනයන එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,000 දක්වා සියයට 20 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ අනුපාතය සියයට 5.2 කින් පහත වැටුණි. අන්තර් සහ ආයෝජන භාණ්ඩයන්හි මිල ගණන් තියුණු ලෙස වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2004 වසරේ පැවැති නියඟය, බොරතෙල් සහ ආහාර ද්‍රව්‍ය ආනයන අවශ්‍යතාවය තීව්‍ර කළ අතර, ඓතිහාසිකව වාර්තා වූ ඉහළ ඛනිජ තෙල් මිල ගණන් ඛනිජ තෙල් ආනයන පිරිවැය තියුණු ලෙස වැඩිවීමට ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ ගිණුමෙහි හිඟය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,243 දක්වා පුළුල් වූ අතර, එම හිඟයේ කොටසක්, සේවා ගිණුමෙහි විදේශ සංක්‍රාම සහ ශුද්ධ ලැබීම් මඟින් මූල්‍යකරණය කිරීමත් සමඟ ජංගම ගිණුමෙහි හිඟය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 648 කට සීමා කිරීමට හැකි විය. සේවා ගිණුමෙහි අතිරික්තයට විශාල වශයෙන් දායක වූ සංචාරක ඉපැයීම්වල ඇති වූ වර්ධනය කෙරෙහි ගෝලීය ආර්ථිකයේ වූ ඉහළ වර්ධනය සහ තවදුරටත් පවත්නා සටන් විරාමය මඟින් නිර්මාණය වූ සාමකාමී වාතාවරණය ඉවහල් විය. රට තුළට වූ ශුද්ධ ගලාඒම් අතර ප්‍රධානතම ස්ථානය තවදුරටත් පවත්වා ගනිමින් 2004 වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබුණු ප්‍රේෂණ, සියයට 11කින් පමණ වර්ධනය විය. කෙසේ නමුදු, සේවා ගිණුමෙහි හා සංක්‍රාම ගිණුමෙහි වූ අතිරික්තය, වෙළෙඳ හා ආදායම් ගිණුමෙහි පැවැති හිඟය සම්පූර්ණයෙන් පියවීමට ප්‍රමාණවත් නොවූ බැවින් ජංගම ගිණුමෙහි ශේෂය තවදුරටත් අයහපත් විය.

රජය වෙත ලැබුණු විදේශ ආධාර ප්‍රදානයන් පහත වැටීම හේතුවෙන් මූල්‍ය හා ප්‍රාග්ධන ගිණුම්වල ශුද්ධ ගලාඒම් පහත වැටීම මෙම අයහපත් තත්ත්වය තවදුරටත් උග්‍ර වීමට හේතු විය. විදේශීය ආයෝජකයින්ගේ විශ්වසනීයත්වය වැඩි දියුණු

**5.1 රූප සටහන**
**විදේශීය වෙළෙඳම**

**ආනයන හා අපනයන වටිනාකම**




**ආනයන සහ අපනයන පරිමා දර්ශක (1997 = 100)**




**ආනයන සහ අපනයන ඒකක මිල දර්ශක සහ වෙළඳ අනුපාතය (1997 = 100)**



**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

**(වාණිජ බැංකු සතු වි.ව්‍ය.මු.බැ. ඒකක සහභාගිත්වය දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා) (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2000 | 2001 | 2002 | 2003 | 2004 (ආ) | 2000 | 2001 | 2002 | 2003 | 2004 (ආ) |
| වෙළෙඳ ශේෂය | -1,798 | -1,157 | -1,406 | -1,539 | -2,243 | -134,176 | -102,592 | -134,706 | -148,324 | -227,171 |
| අපනයන | 5,522 | 4,817 | 4,699 | 5,133 | 5,757 | 420,114 | 430,372 | 449,855 | 495,426 | 583,967 |
| ආනයන | 7,320 | 5,974 | 6,106 | 6,672 | 8,000 | 554,290 | 532,964 | 584,561 | 643,750 | 811,138 |
| සේවා (ශුද්ධ) (ඇ) | 38 | 204 | 295 | 399 | 419 | 2,907 | 14,692 | 28,224 | 38,443 | 42,735 |
| ලැබීම් | 953 | 1,355 | 1,268 | 1,411 | 1,527 | 72,187 | 120,937 | 121,340 | 136,123 | 154,746 |
| ගෙවීම් | 915 | 1,151 | 974 | 1,012 | 1,108 | 69,280 | 106,246 | 93,115 | 97,680 | 112,011 |
| ආදායම (ශුද්ධ) | -305 | - 267 | -252 | -172 | -204 | -23,009 | -23,842 | -24,167 | -16,535 | -20,688 |
| ලැබීම් | 152 | 108 | 75 | 170 | 157 | 11,568 | 9,584 | 7,201 | 16,385 | 15,813 |
| ගෙවීම් | 456 | 375 | 328 | 341 | 360 | 34,577 | 33,425 | 31,368 | 32,920 | 36,501 |
| **භාණ්ඩ සේවා හා ආදායම (ශුද්ධ)** | **-2,064** | **-1,220** | **-1,364** | **-1,312** | **-2,028** | **-154,278** | **-111,742** | **-130,648** | **-126,416** | **-205,124** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 974 | 984 | 1,097 | 1,205 | 1,350 | 73,620 | 87,837 | 104,980 | 116,350 | 136,672 |
| ලැබීම් (ඈ) | 1,160 | 1,155 | 1,287 | 1,414 | 1,564 | 87,697 | 103,180 | 123,183 | 136,475 | 158,291 |
| ගෙවීම් | 186 | 172 | 190 | 209 | 214 | 14,078 | 15,343 | 18,202 | 20,125 | 21,619 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 24 | 22 | 31 | 36 | 30 | 1,801 | 1,925 | 2,982 | 3,441 | 3,038 |
| **ජංගම ගිණුම** | **-1,066** | **- 215** | **-236** | **-71** | **-648** | **-78,857** | **-21,980** | **-22,686** | **-6,625** | **-65,414** |
| **ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම** | **443** | **562** | **444** | **722** | **636** | **31,827** | **49,077** | **40,639** | **69,723** | **62,138** |
| ප්‍රාග්ධන ගිණුම | 50 | 198 | 65 | 74 | 64 | 3,795 | 17,766 | 6,219 | 7,146 | 6,573 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) (ඉ) | 50 | 198 | 65 | 74 | 64 | 3,795 | 17,766 | 6,219 | 7,146 | 6,573 |
| ලැබීම් | 56 | 203 | 71 | 81 | 71 | 4,230 | 18,241 | 6,782 | 7,768 | 7,242 |
| ගෙවීම් | 6 | 5 | 6 | 6 | 7 | 435 | 475 | 563 | 622 | 669 |
| **මූල්‍ය ගිණුම** | **393** | **364** | **379** | **648** | **572** | **28,032** | **31,311** | **34,420** | **62,577** | **55,565** |
| දිගු කාලීන | 304 | 163 | 326 | 722 | 684 | 22,594 | 14,337 | 28,911 | 69,721 | 69,805 |
| සෘජු ආයෝජන | 176 | 172 | 185 | 201 | 227 | 13,319 | 15,271 | 17,716 | 19,450 | 22,826 |
| විදේශීය සෘජු ආයෝජන (ශුද්ධ) | 173 | 82 | 181 | 171 | 217 | 13,119 | 7,310 | 17,281 | 16,557 | 21,948 |
| පෞද්ගලීකරණ ලැබීම් | 3 | 90 | 5 | 30 | 10 | 200 | 7,961 | 435 | 2,893 | 878 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ)(ඇ) | 82 | -257 | -21 | -33 | 18 | 5,622 | -22,918 | -2,039 | -3,201 | 2,270 |
| ලැබීම් (ඊ) | 298 | 44 | 115 | 101 | 169 | 22,134 | 4,016 | 11,007 | 9,738 | 17,503 |
| ගෙවීම් (ඉ) | 216 | 301 | 136 | 134 | 151 | 16,512 | 26,934 | 13,046 | 12,939 | 15,233 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) | 47 | 249 | 162 | 554 | 439 | 3,653 | 21,984 | 13,233 | 53,472 | 44,709 |
| ලැබීම් | 355 | 575 | 542 | 913 | 771 | 26,965 | 51,193 | 51,843 | 88,106 | 78,299 |
| ගෙවීම් | 308 | 326 | 380 | 359 | 331 | 23,312 | 29,209 | 38,610 | 34,634 | 33,590 |
| කෙටිකාලීන | 88 | 201 | 53 | -75 | -112 | 5,438 | 16,974 | 5,509 | -7,145 | -14,240 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | -45 | -11 | 25 | 2 | 11 | -3,355 | -1,025 | 2,443 | 209 | 1,109 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 100 | -42 | 68 | 19 | 28 | 7,569 | -3,798 | 6,548 | 1,877 | 2,514 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ) | -141 | 183 | 104 | -94 | -354 | -18,736 | 2,867 | 6,893 | -9,090 | -45,367 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ) | 174 | 71 | -145 | -2 | 202 | 19,960 | 18,929 | -10,375 | -141 | 27,504 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | - | - | - | - | - | - | - | - | - | - |
| වි.ගැ.හි. වෙන්කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| රුපියල් අගය පිළිබඳ ගැලපීම | - | - | 93 | - | - | 5,189 | 22,245 | 8,900 | - | - |
| වැරදීම හා අත්හැරීම් | 101 | - 127 | 38 | -148 | -193 | 10,902 | -19,578 | 9,197 | -14,487 | -4,198 |
| **සමස්ත ශේෂය (උ)** | **-522** | **220** | **338** | **502** | **-205** | **-30,939** | **29,765** | **36,051** | **48,610** | **-7,474** |
| මූල්‍ය වෙනස්වීම් (උ) | 522 | -220 | -338 | -502 | 205 | 30,939 | -29,765 | -36,051 | -48,610 | 7,474 |
| විනිමය අනුපාතය ශ්‍රී ලං.රු./එ.ජ.ඩොලර් | | | | | | 75.78 | 89.36 | 95.66 | 96.52 | 101.19 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | -10.8 | -7.4 | -8.5 | -8.4 | -11.4 | -10.7 | -7.3 | -8.5 | -8.4 | -11.4 |
| ජංගම ගිණුම | -6.4 | -1.4 | -1.4 | -0.4 | -3.3 | -6.3 | -1.6 | -1.4 | -0.4 | -3.3 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | -6.6 | -1.5 | -1.6 | -0.6 | -3.4 | -6.4 | -1.7 | -1.6 | -0.6 | -3.4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් ශේෂ අත්පොතේ 5 වන සංස්කරණය (1993) ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත.

(ආ) තාවකාලික

(ඇ) සේවා ලැබීම් තුළ 2001 ජූලි මස කටුනායක ගුවන් තොටුපොලට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් විනාශ වූ ගුවන්යානා සඳහා වූ රක්ෂණ වන්දි ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 382.4ක් ඇතුළත් වන අතර, සේවා ගෙවීම් තුළ එසේ ලැබුණු රක්ෂණ මුදලින් බදුහිමියන්ට ආපසු ගෙවනු ලැබූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 292.8ක් ඇතුළත් වේ. මේ අනුව ශුද්ධ රක්ෂණ වන්දි ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 89.6ක් වේ.

(ඈ) 1990 ගල්ෆ් යුද්ධය නිසා කුවේටයේ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයින්ට වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ. ඩො. 2500 බැගින් 2000 වසරේදී 29,323 දෙනෙකු සඳහා ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 45 ද මෙහි අඩංගු වේ.

(ඉ) 2001 ජූලි මස කටුනායක ගුවන් තොටුපලට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් විනාශ වූ ගුවන්යානා දෙකෙහි තොපියව පැවති ප්‍රාග්ධනය වෙනුවෙන් පෞද්ගලික ප්‍රාග්ධන ගෙවීම් යටතේ කරන ලද එ.ජ .ඩොලර් දශ ලක්ෂ 147.6ක තාක්ෂණ ගෙවීම් ද, ඊට අනුරූපව ප්‍රාග්ධන සංක්‍රාම යටතේ කරන ලද ගැලපුම ද ඇතුළත් ය.

(ඊ) 2000 වසරේදී ගුවන් යානා ආනයනය කිරීම සඳහා ගෙවන ලද අත්තිකාරම් ගෙවීම්වල ගැලපුම, ප්‍රාග්ධන ලැබීම්වල ඇතුළත් වේ.

(උ) මූල්‍ය අංශයේ පියවුම ගණුදෙනු කාලච්ඡේද අවසානයේ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

**5.2 රූප සටහන**
**ගෙවුම් තුලනය**




වීම පිළිබිඹු කරමින් විදේශීය සෘජු ආයෝජන, ණය ප්‍රාග්ධනය සහ විවිධ ආයෝජන තුළින් පෞද්ගලික අංශයට ගලා ආ ප්‍රාග්ධන ප්‍රවාහයන් ඉහළ යාම 2004 වසරේහි මූල්‍ය ගලාඒම්හි කැපී පෙනෙන වර්ධනයක් විය. කෙසේ නමුදු, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම්වල පැවැති ශුද්ධ ගලාඒම්, ජංගම ගිණුමේ වූ හිඟය පියවීමට ප්‍රමාණවත් නොවූ හෙයින්, පසුගිය වසර තුනෙහි අඛණ්ඩව පැවති අතිරික්තයට එරෙහිව ගෙවුම් ශේෂයෙහි හිඟයක් ඇති කළේය. මෙම තත්ත්වය විදේශ තිල සංචිතය පහත වැටීමට හා විදේශ විනිමය කෙරෙහි වූ පීඩනය වැඩි වීමට හේතු විය. මෙම අයහපත් වාතාවරණය තුළ, 2001 වසරේ සිට ශ්‍රී ලංකාව අනුගමනය කළ ස්වාධීන පාවෙන විනිමය අනුපාතික ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාම බාහිර කම්පනයන් මගින් ඇති වූ අහිතකර බලපෑම යම්තාක් දුරට සමනය කිරීමට සහ බාහිර තරගකාරිත්වය පවත්වා ගැනීමට උපකාරී විය. මේ අතරතුර, වසර තුළ ශුද්ධ ණය ප්‍රාග්ධන ගලා ඒම් පහළ මට්ටමක පැවතීම පිළිබිඹු කරමින් ද.ජා. නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස රටෙහි විදේශ ණය අනුපාතිකය ආන්තික වශයෙන් පහළ ගියේය. ධනාත්මක සඳහනක් ලෙස, ණය සේවා අනුපාතය, පහළ හා පාලනය කළහැකි මට්ටමක තවදුරටත් පැවතියේය.

## 5.2 විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ ආයතනික පහසුකම්

ශ්‍රී ලංකාව 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ VIII වගන්තිය අනුව ඇතිකර ගත් සම්මුතියට අනුව නිදහස් හා ලිබරල් පරිසරයක් තුළ ජාත්‍යන්තර වෙළෙඳම 2004 වසරේ දී තවදුරටත් ක්‍රියාත්මක විය. නොකඩවා වර්ධනය වෙමින් පවත්නා ලිබරල් ආර්ථික පරිසරය සහ පුළුල් වූ නිදහස තුළින් ඇති වූ වාසිදයක තත්ත්වය, ශ්‍රී ලංකාවේ වෙළෙඳම, ආයෝජන සහ ගෙවීම් වර්ධනය වීමට ඉවහල් වූ අතර, පසුගිය දශක තුනක කාලය තුළ පැවති බාහිර කම්පනයන් සහ පසුගාමී පරිසරයන් මාධ්‍යයේ වුවද, කුඩා විවෘත ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාවේ වර්ධන ප්‍රවනතාවය රඳවා ගැනීමට එය බෙහෙවින් උපකාරී විය. කෙසේ නමුදු, විශාල සහ අනපේක්ෂිතව වෙනස් වන ප්‍රාග්ධන ගලායාම් සහ ගලා ඒම් වලින් ආර්ථිකය ආරක්ෂා කර ගැනීමේ පියවරක් ලෙස ප්‍රාග්ධන ගිණුමේ සීමා කිරීම තවදුරටත් පවත්වා ගැනිණි.

2001 වසරේ සිට ක්‍රියාත්මක කෙරුණු ස්වාධීන පාවෙන විනිමය අනුපාත ක්‍රමය ආර්ථිකයට හිතකර ලෙස බලපෑ අතර, විශේෂයෙන්ම බාධාවන්ට මුහුණදුන් වසර කීපයක් හැරුණු කොට මෙමගින් නොකඩවා වර්ධනය වුන අපනයන අංශය වෙත මහඟු පිටුවහලක් ලැබුණි. ශ්‍රී ලංකාවේ ආර්ථික සිද්ධාන්තවලට සමගාමීව බාහිර ලෝකයේ ඇතිවෙන වෙනස්කම්වලට අනුව මුදලේ අගය ස්වයංක්‍රීයව වෙනස්වන බැවින්, ස්වාධීන පාවෙන විනිමය අනුපාත ක්‍රමය රටේ බාහිර තරඟකාරිත්වය රඳවා ගැනීමට උපකාරී විය.

2004 වසර තුළ දී, බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වික ගිවිසුම් සහ සාකච්ඡා කීපයකටම ප්‍රවිශ්ඨ වෙමින් විදේශීය වෙළෙඳම් වාතාවරණය ශක්තිමත් කෙරිණි. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ඕස්ට්‍රේලියාව සහ ජපානය වැනි ප්‍රධාන රටවල් මගින් අනෙකුත් තරඟකාරී රටවල් වෙත පනවන ලද තීරුබදු ව්‍යූහයට වෙනස් වූ ආකාරයකට ශ්‍රී ලංකාවට පනවන ලද අසමතුලිත තීරුබදු ව්‍යූහයන් නිරාකරණය කරනු වස්, ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධානය තුළ සාකච්ඡා මෙහෙය වනු ලැබීය. දෝහා සංවර්ධන න්‍යාය පත්‍රය අනුව කෘෂිකර්මාන්ත, කෘෂිකාර්මික නොවන වෙළෙඳ ප්‍රවිශ්ඨයන් හා සංවර්ධන තේමාවන් මුල් කරගෙන සාකච්ඡා ඉදිරියට ගෙන යාමට ලෝක වෙළෙඳ සංවිධානයේ මධ්‍යම කවුන්සිලය මගින් මූලික සැලැස්මක් සැකසීමත් සමඟම, කැන්කූන් අමාත්‍ය මට්ටමේ සමුළුවේ දී සාකච්ඡා බිඳවැටීම හේතු කොට ගෙන මන්දගාමී ස්වරූපයට පත්ව තිබූ ලෝක වෙළෙඳ සංවිධානයේ සාකච්ඡා නව මඟකට යොමු විය. මෙම වර්ධනයන් ඔස්සේ, සංවර්ධිත රටවල්හි කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන වෙළෙඳ පොළවල් කරා පුළුල් ලෙස පිවිසීමේ හැකියාව තුළින් ශ්‍රී ලංකාව වාසිදායක තත්වයක් ලබා ගැනීමට නියමිතය. 2004 දී ලෝක වෙළෙඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාවෙහි වෙළෙඳ ප්‍රතිපත්ති පිළිබඳව දෙවැනි විමර්ශනය නිම කරන ලදී. මෙම විමර්ශනයේදී, 1995 වසරේ සිට ක්‍රියාත්මක වූ සමහර ප්‍රතිපත්ති කෙරෙහි විවේචනාත්මකව අදහස් දක්වා තිබුනත් ශ්‍රී ලංකාවෙහි සමස්ථ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳව ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයන් සුභවාදී ආකල්පයක් දැරීය.

ශ්‍රී ලංකාව, 2004 වසරේ පවත්වන ලද එකොළොස්වන එක්සත් ජාතීන්ගේ වෙළෙඳම හා සංවර්ධනය පිළිබඳ සමුළු (UNCTAD XI) සැසි වාරය නියෝජනය කල අතර, එහිදී ණය සහන සහ රාජ්‍ය ණය දරා ගැනීමේ හැකියාව, බාහිරකම්පනවලට පහසුවෙන් ගොදුරුවන සහ ආහාර අපනයනයන්ට වඩා ආනයනය කරන කුඩා ආර්ථිකයන්හි විශේෂිත අවශ්‍යතා, ස්වාභාවික පුද්ගල සංචරණය හරහා වෙළෙඳ පොළ පිවිසුම්, ශ්‍රී ලංකාවේ වෙළෙඳම හා සම්බන්ධ බුද්ධිමය දේපල අයිතිය පිළිබඳ ගැටළු, වෙළෙඳ වරණයන් පිළිබඳ ගෝලීය ක්‍රමය (Global System of Trade Preferences) යටතේ වෙළෙඳ වාසි සහ කුශලතා වර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබා ගැනීම යන කරුණු මත සාකච්ඡා පැවැත්විය.

කලාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංගමයෙහි (SAARC) සියළු රටවල් ඒකකයක් ලෙස සලකා, ප්‍රභවස්ථාන නීති වෙනස් කිරීම තුළින් වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ (Generalised System of Preferences) සංවර්ධිත රටවලින් වාසිදායක තත්ත්වයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව ක්‍රියාකාරීව සහභාගි විය. මෑත කාලීන සුනාමි ඛේදවාචකය සැලකිල්ලට ගනිමින්, යුරෝපීය සංගමය විසින් වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ (GSP) ශ්‍රී ලංකාවට විශේෂිත සහන ප්‍රදානය කිරීමට සලකා බලමින් සිටියි. මීට අමතරව, ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරන මනා කම්කරු ක්‍රියාමාර්ග හේතු කොට ගෙන ශ්‍රී ලංකාවට යුරෝපීය සංගමය විසින් දනටමත් විශේෂ වරප්‍රසාද ලබා දී ඇත.

කලාපීය වශයෙන් ගත්කල, කලාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංගමයේ (SAARC) නායකයින් විසින් දකුණු ආසියානු වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA ), 2006 වසරේ ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවීමට එකඟ වී ඇත. දකුණු ආසියානු වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ කලාපය තුළ වෙළෙඳාම හා ආයෝජන ඉහළ නැංවීම අරමුණ කර ගනිමින් පවතින තීරුබදු අඩුකිරීම හා ඉවත් කිරීම සඳහා දැඩි පරිශ්‍රමයක් දරමින් සිටියි. බංග්ලා දේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය සඳහා වන ආර්ථික සහයෝගිතාව ලෙස පෙර හැඳින් වූ, බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මුලිකත්වය (BIMST-EC) විසින් නිදහස් වෙළෙඳ ගිවිසුමක් පිහිටුවීම සඳහා කෙටුම්පත් ගිවිසුමකට 2004 වසරේ පෙබරවාරි මාසයේ දී අත්සන් කරන ලදී. මෙම සහයෝගිතාවයට සම්බන්ධ රාජ්‍ය නායකයින් සහභාගි වූ ප්‍රථම සමුළුව, 2004 ජූලි මාසයේ තායිලන්තයේ දී පවත්වන ලදී. රටවල් හරහා සිදුවන අපරාධ සහ ත්‍රස්තවාදී මැඩලීම, ක්‍රියා, රෝග උවදුරු මර්ධනය හා මැඩ පැවැත්වීම, දුගීබව දුරු කිරීම, සංචාරක කටයුතු ප්‍රවර්ධනය, බල ශක්ති, ධීවර කර්මාන්තය සහ දේශීය වෛද්‍ය ක්‍රම හා ඒ පිළිබඳ දැනුම පුළුල් කිරීම යන පුළුල් පරාසයක වූ කරුණු මෙම සමුළුවේදී සාකච්ඡාවට බඳුන් කෙරිණි.

2004 වසර, ද්විපාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා ඔස්සේ වඩා ක්‍රියාකාරී වූ වසරක් විය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISLFTA), සේවාවන් සහ ආයෝජන ඇතුළත් කරමින් තවදුරටත් පුළුල් වූ විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් බවට පරිවර්තනය කිරීමට එකඟ විය. 2005 වසරේ පෙබරවාරි මාසයේ දී පකිස්ථාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSLFTA) අත්සන් කරන ලදී. මෙම ගිවිසුම යටතේ, ශ්‍රී ලංකාවේ අපනයන අයිතමයන් 206 ක් සඳහා තිරුබදු රහිතව පකිස්ථානු වෙළඳපොලට පිවිසීමට අවස්ථාව උදවේ. මීට අමතරව තේ සඳහා පංගුවලට යටත්ව පාකිස්ථානු වෙළෙඳපොලට පිවිසීමට අවස්ථාව ලැබේ. 1970 දශකයේ පකිස්ථානු වෙළෙඳපොල ශ්‍රී ලංකාවේ තේ සඳහා අතිශයින් වැදගත් ස්ථානයක් වූ නමුදු, ක්‍රමානුකූලව එම තත්ත්වය කෙන්යාවට හිමිවිය. මෙම ගිවිසුම මගින් අහිමි වූ වෙළෙඳපොල කොටසින් යම් ප්‍රමාණයක් හෝ නැවත අත්පත් කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාව සහ ඉරානය අතර ආර්ථික සහයෝගිතාවය සඳහා වන ඒකාබද්ධ කොමිසමෙහි 7 වන සමුළුව, 2004 ජනවාරි මාසයේදී ඉරානයේදී පැවැත්වුණු අතර, එහිදී වරණීය වෙළෙඳ ගිවිසුමක් අත්සන් කිරීමට දෙරට එකඟ විය. 2004 ඔක්තෝබර් මාසයේ දී පවත්වන ලද ශ්‍රී ලංකා-යුරෝපීය ඒකාබද්ධ කොමිසමේ 16 වන සැසිවාරයේදී, ඇඟළුම් සඳහා වන පංගු ක්‍රමය ඉවත් කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. බැංකොක් ගිවිසුම යටතේ පැවැති තෙවන වටයේ සාකච්ඡා වාරයේදී අපනයන අයිතම රාශියකට අදාළව විශේෂ වරණීය සහන ශ්‍රී ලංකාවට ලැබිණි. 2004 වසර තුළ දී ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතාව පිළිබඳ ගිවිසුමක් (CEPASS) ප්‍රතිස්ථාපනය කරනු වස් සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි.

ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සාකච්ඡා තුළින් වෙළෙඳපොළවලට පිවිසීමට පහසුකම් සැපයීමට අමතරව, රජය විසින් අපනයනකරුවන් වෙත පුළුල් පරාසයක පැතුරුනු සහන තවදුරටත් සලස්වමින් සිටී. 2004 දී අවම ආයෝජන කොන්දේසීන්ට යටත්ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනකරුවන් වෙත විශේෂිත දිරිගැන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරිණි. මෙම විශේෂිත දිරිගැන්වීමේ වැඩ පිළිවෙළට බදු විරාම, බදු සහන සහ ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය සඳහා බදු අත්හැරීම් අඩංගු විය. අලෙවිකරණය, මූල්‍යකරණය සහ අන්තර් ජාතික දත්ත මූලාශ්‍රවලට පිවිසීම ආදී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සහයෝගය ලබාදීමට අමතරව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) විසින්, අපනයනකරුවන්ගේ සංසදය (Exporters Forum) තුළ රජය හා පෞද්ගලික ව්‍යවසායකයන් සම්බන්ධ කරමින් වෙළෙඳාම සහ ආයෝජන පිළිබඳ ගැටළු විසඳීමට පියවර ගන්නා ලදී. රාජ්‍ය හා පෞද්ගලික අංශයෙහි අදහස් හා යෝජනා ඇතුළත් කරමින්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2004-2008 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි ජාතික අපනයන ප්‍රඥප්තියක් (National Export Strategy) එළි දක්වනු ලැබීය. ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාව (SLECIC) තවදුරටත් අපනයන ණය රක්ෂණ සහ ඇපකර හරහා අපනයනකරුවන් වෙත සහන සලස්වනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLS) , ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූලව අපනයන අයිතමයන් සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම සිදු කරන ලදී. 2004 වසර තුළදී, ආර්ථික සංවර්ධනය උදෙසා වූ ජාතික සභාව (NCED) හි වෙළෙඳ හා තීරුබදු කමිටුව (Trade and Tariff Cluster) සහ අපනයන කමිටුව (Export Cluster) විදේශීය වෙළෙඳාම හා සම්බන්ධ ගැටළු විමර්ශණය කරන ලද අතර, එම ගැටළු නිරාකරණය කිරීම සහ වෙළෙඳාම පුළුල්

කිරීම සඳහා අදාළ නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. 2005 අයවැය මඟින්, අපනයනවල එකතු කළ අගය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, දිරිගැන්වීම් රාශියක් හඳුන්වා දෙන ලදී. ඒවා අතර, අන්තර් භාණ්ඩ දේශීය සැපයුම්කරුවන් සඳහා වටිනාකම මත එකතු කරනු ලබන බදු අඩු කිරීම, දියුණු තාක්ෂණය අත්පත් කර ගැනීම සඳහා තීරු බදු රහිත සහන සැපයීම, තාක්ෂණ සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම, වටිනාකම මත එකතු කරනු ලබන බදු ව්‍යුහය සරල කිරීම සහ ඇහළුම් මිලදී ගන්නා කාර්යාල සඳහා එකතු කළ වටිනාකම මත අය කරන බදු ප්‍රමාණය ශුන්‍ය දක්වා පහත හෙළීම වැනි වරප්‍රසාද රැසක් ඇතුළත් විය.

අපනයන අයිතම කීපයක් සම්බන්ධයෙන් අදාළ කර්මාන්තයන්හි සංවර්ධනය සහ පර්යේෂණ වෙනුවෙන් අරමුදලක් සම්පාදනය කිරීම උදෙසා සෙස් බද්දකට යටත් කරන ලදී. තේ සහ පොල් සඳහා පවතින සෙස් බද්ද තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අමතරව, 2004 දී කුරුඳු අපනයන සඳහා සෙස් බද්දක් හඳුන්වා දෙන ලද අතර, රබර් අපනයන සඳහා වූ සෙස් බද්ද නැවත හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නැංවීම, රාජ්‍ය ආදායම ඉහළ නැංවීම, තීරුබදු ව්‍යුහය සරල කිරීම සහ ජීවන වියදම පහත හෙළීම වැනි බහු විධ පරමාර්ථයන් පෙරදැරිව ආනයන තීරුබදු ව්‍යුහයේ වෙනස් කිරීම් සිදු කෙරිණි. කෙසේ නමුදු, මෙම සියළු පරමාර්ථයන් එකවර මුදුන් පමුණුවා ගැනීමේ දුෂ්කරතාවය තහවුරු විය. උදාහරණයක් ලෙස, ආදායම වැඩි කිරීමේ අරමුණින්, 2004 වසරේ ජනවාරි 01 දින සිට සියයට 2.5, 5, 10, 15, 20 සහ 25 යන තීරුබදු පරාසයන්, සියයට 3, 6, 12, 16, 20 සහ 27.5 දක්වා වෙනස් කළ නමුදු, එය නිෂ්පාදන පිරිවැය ඉහළයාමට ඉවහල් විණි. මේ සමඟම තිරිඟු ඇට, ඛනිජ තෙල්, පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදිත, මුද්‍රිත පොත්, මැණික් සහ රත්‍රං, රෙදිපිළි, වී හා එළවළු බීජ සහ ඖෂධ වර්ග සඳහා බදු අත්හැරීම් ප්‍රදානය කරන ලදී. මෙම බදු අත්හැරීම්වලට අමතරව දේශීය මිල ඉහළ යාම පාලනය කිරීමේ අරමුණින් පරිප්පු, අර්තාපල්, ලොකු ලූණු, මිරිස් හා කිරිපිටි සඳහා පූර්ණ හා පාර්ශ්වික වශයෙන් බදු අත්හැරීම්, 2004 පෙබරවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදී. වසරේ සෙසු කාලය තුළ ජනතාවට තවදුරටත් සහන සැලසීම සඳහා සීනි සහ සහල් සඳහා බදු අත්හැරීම් ප්‍රදානය කෙරුන නමුදු, ලොකු ලූණු සහ දුඹුරු සීනි සඳහා තීරුබදු නැවත පනවන ලදී. (විශේෂ සටහන 5 බලන්න.)

වාහන ආනයන පිරිවැය අඩුකිරීමේ පියවරක් ලෙස 2004 වසර ආරම්භයේදී, පාවිච්චි කරන ලද වාහන ආනයන කළහැකි උපරිම කාලසීමාව මාස හයකින්, එනම් අවුරුදු තුනහමාර දක්වා දීර්ඝ කරන ලදී. ඉහළ ගිය ඛනිජ තෙල් මිල හමුවේ ඉන්ධන පිරිමැසුමේ පියවරක් ලෙස, අතිශයින් ඉහළ වටිනාකම් සහිත සහ අකාර්යක්ෂම ලෙස ඉන්ධන භාවිතා කරන වාහන, විශාල වශයෙන් ආනයන කිරීම අධෛර්යමත් කිරීමේ පියවරක් ලෙස, 2004 ඔක්තෝබර් මස 15 දින සිට බලපැවැත්වෙන පරිදි බදු අනුපාතිකයන් ඉහළ නංවන ලදී. මෙම ක්‍රියාමාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, මෙම වාහන ආනයන කිරීමේදී, වටිනාකම අනුව සියයට 100 ක තැන්පතු අවශ්‍යතාවයකට ද යටත් කෙරිණි. 2005 වසරේ ආරම්භයේ සිට බලපැවැත්වෙන පරිදි 2004 නොවැම්බර් 19 වන දින, 2005 අයවැය මඟින් සයවිධි තීරුබදු ව්‍යුහය, 2.5, 6, 15 සහ 28 වශයෙන් නව තීරුබදු ව්‍යුහයකට පරිවර්තනය කරන ලදී. ශ්‍රී ලංකාවේ තීරුබදු සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා ආර්ථික සංවර්ධනය උදෙසා වූ ජාතික සභාව (NCED) යටතේ ක්‍රියාත්මක වන පරිදි ජනාධිපති තීරුබදු කොමිසම නැවත ස්ථාපනය කරන ලදී. විවිධාකාර බදු අත්හැරීම් හා තීරු බදු අඩු කිරීම් හි අවසාන ප්‍රතිඵලය ලෙස වඩාත් ලිබරල් වෙළෙඳ ක්‍රමයක්, 2004 වසරේ ක්‍රියාත්මක වූ බව පිළිබිඹු කරමින්, අපනයන මත වූ තීරුබදු සාමාන්‍යය පහත වැටුණි. 2004 වසරේදී තීරුබදු සාමාන්‍යය 5.3 සිට 4.5 දක්වා පහත වැටුණි. පහළ මට්ටමක හා අපේක්ෂා කළහැකි බදු ව්‍යුහයක් පවත්වාගෙන යාම, ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වය වැඩිවීමට හා සම්පත් බෙදීයාමේ

**5.2 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාත (අ)**

| ශීර්ෂය | 2000 | 2001 (ආ) | 2002 (ආ) | 2003 (ඇ) | 2004 (ඈ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **11.5** | **13.3** | **13.3** | **13.5** | **10.4** |
| ආහාර හා පාන වර්ග | 11.7 | 15.3 | 14.4 | 14.2 | 8.5 |
| සහල් | 30.0 | 21.2 | 32.9 | 29.1 | 4.9 |
| පිටි | 6.2 | 13.3 | 12.3 | 11.5 | 7.2 |
| සීනි | 15.9 | 16.2 | 16.0 | 16.8 | 4.6 |
| තිරිඟු හා ධාන්‍ය | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.1 |
| කිරි හා කිරි නිෂ්පාදන | 10.6 | 15.3 | 11.9 | 12.2 | 7.9 |
| කරවල | 1.3 | 2.0 | 7.9 | 10.8 | 5.9 |
| වෙනත් මාළු නිෂ්පාදන | 5.1 | 6.3 | 6.8 | 7.9 | 10.0 |
| වෙනත් ආහාර | 18.7 | 25.4 | 22.9 | 22.3 | 17.4 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 11.3 | 10.9 | 12.1 | 13.0 | 12.2 |
| මෝටර් රථ හා යතුරු පැදි | 16.6 | 21.1 | 23.3 | 22.1 | 21.1 |
| ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 6.8 | 8.3 | 8.6 | 8.9 | 9.4 |
| රබර් ටයර් හා ටියුබ් | 23.5 | 29.6 | 27.9 | 26.0 | 25.8 |
| බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන | 0.5 | 0.6 | 0.6 | 0.6 | 0.6 |
| ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය | 11.1 | 9.7 | 9.4 | 9.2 | 8.9 |
| **අන්තර් භාණ්ඩ** | **2.9** | **1.7** | **1.6** | **1.5** | **1.9** |
| පොහොර | - | - | 0.4 | 2.6 | 3.1 |
| බොරතෙල් | 7.4 | … | 0.0 | 0.0 | 0.0 |
| වෙනත් ඛණිජ තෙල් | 5.3 | 0.9 | 0.8 | 0.8 | 0.9 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 3.2 | 3.3 | 1.1 | 2.2 | 2.6 |
| ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ වර්ග | 5.2 | 6.3 | 4.0 | 4.6 | 4.5 |
| කඩදාසි හා ඝන කඩදාසි | 5.0 | 6.7 | 5.2 | 5.4 | 6.0 |
| රෙදිපිළි හා ඇහළුම් | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.0 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 3.5 | 4.2 | 4.3 | 3.3 | 4.3 |
| **ආයෝජන භාණ්ඩ** | **4.0** | **5.3** | **5.5** | **7.2** | **6.1** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 7.5 | 9.3 | 7.4 | 7.7 | 9.0 |
| ගමනාගමන උපකරණ | 7.4 | 10.3 | 11.0 | 12.9 | 11.9 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 1.8 | 2.7 | 3.7 | 5.6 | 3.2 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 3.2 | 4.2 | 3.8 | 4.6 | 5.0 |
| **එකතුව** | **4.5** | **4.9** | **4.8** | **5.3** | **4.5** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (මි. ර. ගැ.) ප්‍රතිශතයක් ලෙස

(ආ) 2001 පෙබරවාරි මස 21 වැනි දින තෝරාගත් ආනයන මත පනවන ලද සියයට 20 ක අධිභාරය හා 2002 අප්‍රේල් 1 වැනි දින සිට සියයට 20ක අධිභාරය ඇතුළත් වේ.

(ඇ) 2003 ජනවාරි මස 01 වැනි දින සිට තෝරා ගත් ආනයන මත පනවන ලද සියයට 20 ක අධිභාරය ඇතුළත් වේ.

(ඈ) තාවකාලිකයි

**5.3 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ දර්ශක (අ)**

1997 = 100

| භාණ්ඩ | 2003 වටිනාකම් දර්ශකය | 2003 පරිමා දර්ශකය | 2003 ඒකක වටිනාකම් දර්ශකය | 2004 (ආ) වටිනාකම් දර්ශකය | 2004 (ආ) පරිමා දර්ශකය | 2004 (ආ) ඒකක වටිනාකම් දර්ශකය | වර්ධන අනුපාතය (ආ) වටිනාකම් දර්ශකය | වර්ධන අනුපාතය (ආ) පරිමා දර්ශකය | වර්ධන අනුපාතය (ආ) ඒකක වටිනාකම් දර්ශකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **90.8** | **109.6** | **82.9** | **100.3** | **112.9** | **88.8** | **10.4** | **3.1** | **7.1** |
| තේ | 94.8 | 112.0 | 84.6 | 102.5 | 113.8 | 90.1 | 8.1 | 1.6 | 6.4 |
| රබර් | 49.0 | 58.1 | 84.3 | 65.3 | 65.6 | 99.5 | 33.3 | 12.8 | 18.1 |
| පොල් | 78.8 | 96.5 | 81.6 | 96.1 | 112.8 | 85.2 | 22.1 | 16.9 | 4.5 |
| අනෙකුත් කෘෂි කාර්මික නිෂ්පාදන | 103.5 | 135.9 | 76.2 | 111.7 | 134.6 | 83.0 | 7.9 | -1.0 | 9.0 |
| **කාර්මික අපනයන** | **115.5** | **124.1** | **93.1** | **130.9** | **135.4** | **96.7** | **13.3** | **9.1** | **3.8** |
| රෙදිපිළි හා ඇඟළුම් | 113.0 | 118.5 | 95.4 | 123.2 | 127.7 | 96.5 | 9.1 | 7.8 | 1.2 |
| ඛණිජතෙල් නිෂ්පාදන | 67.0 | 45.8 | 146.4 | 102.3 | 59.4 | 172.1 | 52.6 | 29.8 | 17.6 |
| වෙනත් කාර්මික අපනයන | 125.3 | 143.2 | 87.5 | 149.8 | 158.9 | 94.3 | 19.6 | 11.0 | 7.8 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **93.6** | **91.5** | **102.4** | **134.2** | **96.1** | **139.7** | **43.4** | **5.1** | **36.5** |
| මැණික් | 94.9 | 92.9 | 102.1 | 130.7 | 96.2 | 135.8 | 37.7 | 3.5 | 33.0 |
| අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය අපනයන | 76.8 | 72.2 | 106.4 | 181.5 | 94.5 | 192.1 | 136.3 | 30.9 | 80.5 |
| **මුළු අපනයන** | **110.4** | **120.1** | **92.0** | **123.9** | **129.4** | **95.7** | **12.2** | **7.8** | **4.0** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **124.0** | **152.4** | **81.4** | **132.9** | **158.4** | **83.9** | **7.2** | **3.9** | **3.2** |
| ආහාර හා පානවර්ග | 87.9 | 105.4 | 83.4 | 92.8 | 102.5 | 90.6 | 5.6 | -2.7 | 8.6 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 176.4 | 220.7 | 79.9 | 191.1 | 239.5 | 79.8 | 8.3 | 8.5 | -0.2 |
| **අන්තර් භාණ්ඩ** | **121.9** | **127.3** | **95.8** | **149.2** | **135.7** | **110.0** | **22.4** | **6.6** | **14.8** |
| පොහොර | 132.0 | 131.6 | 100.3 | 160.7 | 130.4 | 123.2 | 21.7 | -0.9 | 22.8 |
| බොර තෙල් | 163.4 | 110.0 | 148.6 | 229.2 | 121.3 | 189.0 | 40.2 | 10.3 | 27.2 |
| අනෙකුත් ඛනිජ තෙල් | 147.4 | 102.5 | 143.8 | 219.3 | 110.3 | 198.9 | 48.8 | 7.6 | 38.3 |
| රසායනික ද්‍රව්‍ය සහ සංයෝග | 124.7 | 143.4 | 86.9 | 151.4 | 150.6 | 100.5 | 21.4 | 5.0 | 15.6 |
| තිරිඟු සහ ධාන්‍ය | 99.5 | 116.3 | 85.6 | 132.9 | 125.8 | 105.6 | 33.5 | 8.2 | 23.4 |
| රෙදිපිළි | 99.0 | 114.2 | 86.7 | 109.2 | 125.0 | 87.4 | 10.3 | 9.4 | 0.8 |
| ප්ලාස්ටික් | 130.0 | 156.0 | 83.3 | 166.2 | 159.0 | 104.5 | 27.9 | 1.9 | 25.5 |
| දියමන්ති | 163.3 | 139.9 | 116.7 | 163.6 | 125.7 | 130.1 | 0.2 | -10.1 | 11.5 |
| වෙනත් | 129.0 | 167.1 | 77.2 | 156.0 | 174.4 | 89.4 | 20.9 | 4.4 | 15.8 |
| **ආයෝජන භාණ්ඩ** | **99.6** | **145.9** | **68.2** | **125.9** | **172.8** | **72.9** | **26.5** | **18.4** | **6.8** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 120.8 | 145.0 | 83.3 | 147.9 | 169.0 | 87.5 | 22.4 | 16.5 | 5.1 |
| ප්‍රවාහන උපකරණ | 99.0 | 82.1 | 120.6 | 123.3 | 93.7 | 131.6 | 24.6 | 14.2 | 9.1 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 93.9 | 173.1 | 54.2 | 115.3 | 205.5 | 56.1 | 22.9 | 18.7 | 3.5 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 85.5 | 80.7 | 105.8 | 149.5 | 106.2 | 140.8 | 74.9 | 31.5 | 33.0 |
| **මුළු ආනයනය** | **113.7** | **136.5** | **83.3** | **136.0** | **148.8** | **91.4** | **19.9** | **9.0** | **9.7** |
| වෙළෙඳ අනුපාතය | | | 110.4 | | | 104.7 | | | -5.2 |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලිකයි

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කාර්යක්ෂමතාවය වැඩිවීමට හේතු වන අතර ඒ තුළින් දිගුකාලීන ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගතහැකි බව මෙහිදී සඳහන් කළයුතුය.

## 5.3 භාණ්ඩ වෙළෙඳාම සහ වෙළෙඳ හිගය

අපනයන හා ආනයන යන දෙඅංශයෙහිම ඇති වූ වර්ධනයන් සමඟ 2004 වසර තුළදී, විදේශ වෙළෙඳාම තවදුරටත් ප්‍රසාරණය විය. 2003 වසරේ වාර්තාගත වූ සියයට 9 ක අපනයන වර්ධනය හා සැසඳීමේදී, 2000 වසරෙන් පසුව වාර්තාගත ඉහළම ක්‍රියාකාරීත්වය වෙත ළඟාවෙමින්, අපනයන ආදායම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 5,757 දක්වා සියයට 12 කින්, වර්ධනය විය. 2003 වසරේ සියයට 9 ක වර්ධනය අභිබවා තියුණු වර්ධනයක් වාර්තා කරමින්, ආනයන වියදම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,000 දක්වා සියයට 20 කින් වර්ධනය විය. මෙම තත්ත්වය වෙළෙඳ ශේෂය, එ.ජ. ඩොලර් දශ ලක්ෂ 704 කින් වැඩි කරලීමට ඉවහල් වූ අතර, එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,243 දක්වා පුළුල් විය.

2004 වසරේදී, අපනයන ඒකක මිල දර්ශකය සියයට 4 කින් වර්ධනය වීමට අන්තර් ජාතික වෙළෙඳපොළේ තේ, රබර් සහ මැණික් සඳහා පැවැති ඉහළ ඉල්ලුම උපකාරී විය. කෙසේ නමුත් ඛනිජ තෙල්, ගොඩනැගිලි ද්‍රව්‍ය, පොහොර, තිරිඟු, සීනි සහ කිරි නිෂ්පාදිතයන්හි මිල ඉහළයාම පිළිබිඹු කරමින්, තියුණු ලෙස ඉහළ ගිය ආනයන ඒකක මිල

දර්ශකයේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ අනුපාතය සියයට 5.2 කින් පහත වැටුණි. අපනයන පදනම සීමාවීම සහ වෙළෙඳපළ කීපයක් මත අතිශයින්ම රඳා පැවතීම, ශ්‍රී ලංකාවෙහි අපනයන ක්‍රියාකාරිත්වයෙහි කැපී පෙනෙන අවදනම් තත්ත්වයක් ලෙස හැඳින්විය හැක.

### අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ඉපැයීම්හි සියයට 78 ක ඉහළ නියෝජනයක් සහිතව කාර්මික අපනයන ප්‍රමුඛත්වය ගත් අතර, කෘෂිකාර්මික අපනයනවල දායකත්වය සියයට 19 ක් විය. එබැවින් අපනයන වර්ධනය සඳහා, කාර්මික අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, එහි දායකත්වය සියයට 85 ක් විය. මේ හා අදාල කෘෂිකාර්මික අපනයනවල දායකත්වය සියයට 16 ක් විය.

තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වැවිලි භෝග ත්‍රිත්වයෙහි ඉහළ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, 2004 වසරේදී කෘෂිකාර්මික අපනයන සියයට 10 කින් ඉහළ ගියේය. ඉහළ මිල ගණන් තේ සඳහා වාසිදායක ලෙස බලපෑ අතර, පරිමාවේ වූ ඉහළ වර්ධනය පොල් අපනයන ඉපැයීම් ඉහළ නැංවීමට ඉවහල් විය. රබර් අපනයන ඉපැයීම්, පරිමාව හා මිල යන දෙඅංශයේම දායකත්වය නිසා ඉහළ ගියේය. මැදපෙරදිග, රුසියාව ඇතුළු ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලින් ඇති වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් තේ මිල සියයට 7 කින් වර්ධනය වී කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 2.46 ක් දක්වා වැඩි විය. මුළු තේ අපනයනයෙන් සියයට 19 කට දායක වූ රුසියාව 2004 වසරේ ශ්‍රී ලංකාවේ විශාලතම තේ ගැනුම්කරු වූ අතර, ඉන්පසු ප්‍රධාන ගැනුම්කරුවන් වූයේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ තුර්කියයි. තේ අපනයන පරිමා දර්ශකයේ සියයට 1 ක සුළු වර්ධනයට හේතු වූයේ තේ නිෂ්පාදනයේ වූ මධ්‍යස්ථ වර්ධනයි. මේ නිසා මෙතෙක් ලොව ප්‍රධානතම තේ අපනයනය කළ රට වූ ශ්‍රී ලංකාව අභිබවා යාමට ඉහළ නිෂ්පාදන වර්ධනයක් සහිත කෙන්යාවට හැකිවිය. ඉල්ලුම පහත වැටීම නිසා අගය එකතු කළ තේ, පැකට් තේ සහ හරිත තේ අපනයනයන්හි වෙළෙඳපොළ කොටස පහත වැටුණි. කපාපු පොල් සහ ගුඩිරි මෙට්ට අපනයන ඉහළ යාමත් සමග 2004 වසරේදී, පොල් අපනයනය සියයට 22

**5.4 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

එ.ජ. ඩොලර් දශ ලක්ෂ

| ශීර්ෂය | 2003 වටිනාකම | 2003 ප්‍රතිශතය | 2004 (අ) වටිනාකම | 2004 (අ) ප්‍රතිශතය | වටිනාකමේ වෙනස(අ) | වර්ධන අනුපාතය(අ) | වර්ධනයට වූ දායකත්වය(අ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **965** | **19** | **1,065** | **19** | **100** | **10.4** | **16.0** |
| තේ | 683 | 13 | 739 | 13 | 56 | 8.2 | 8.9 |
| රබර් | 39 | 1 | 51 | 1 | 12 | 30.8 | 1.9 |
| පොල් | 93 | 2 | 113 | 2 | 20 | 21.5 | 3.2 |
| මද නිෂ්පාදන | 48 | 1 | 59 | 1 | 11 | 22.9 | 1.8 |
| වෙනත් | 45 | 1 | 54 | 1 | 9 | 20.0 | 1.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදන | 150 | 3 | 162 | 3 | 12 | 8.0 | 1.9 |
| **කාර්මික අපනයන** | **3,977** | **77** | **4,506** | **78** | **529** | **13.3** | **84.8** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 145 | 3 | 175 | 3 | 30 | 20.7 | 4.8 |
| රෙදිපිළි හා ඇඟළුම් | 2,575 | 50 | 2,809 | 49 | 234 | 9.1 | 37.5 |
| ඛණිජ නිෂ්පාදන | 65 | 1 | 100 | 1 | 35 | 53.8 | 5.6 |
| රබර් නිෂ්පාදන | 231 | 5 | 283 | 5 | 52 | 22.5 | 8.3 |
| පිඟන් නිෂ්පාදන | 42 | 1 | 47 | 1 | 5 | 11.9 | 0.8 |
| සම්, සංචාරක භාණ්ඩ හා සපත්තු | 58 | 1 | 43 | 0 | -15 | -25.9 | -2.4 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 290 | 6 | 386 | 7 | 96 | 33.1 | 15.4 |
| දියමන්ති හා ස්වර්ණාභරණ (ආ) | 233 | 5 | 265 | 5 | 33 | 13.7 | 5.1 |
| අනෙකුත් කාර්මික උපකරණ | 337 | 7 | 398 | 7 | 61 | 18.1 | 9.6 |
| **ඛණිජ අපනයන** | **84** | **2** | **120** | **2** | **36** | **42.9** | **5.8** |
| මැණික් | 79 | 2 | 109 | 2 | 30 | 38.0 | 4.8 |
| වෙනත් | 5 | 0 | 11 | 0 | 6 | 120.0 | 1.0 |
| | | | | | | | 0.0 |
| **වර්ග නොකළ අපනයන (ඇ)** | **108** | **2** | **66** | **1** | **-42** | **-38.9** | **-6.7** |
| **මුළු අපනයන (ඈ)** | **5,133** | **100** | **5,757** | **100** | **624** | **12.2** | **100.0** |
| වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය | 96.52 | | 101.19 | | | | |

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් සපයන ලද දියමන්ති අපනයන පිළිබඳ දත්තයන් 1999 සිට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබාගත් දත්ත හා ගලපන ලදී.

(ඇ) ප්‍රති අපනයන ඇතුළත් ය.

(ඈ) ගලපන ලදී.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛණිජ තෙල් නිෂ්පාදන අපනයනකරුවෝ
ශ්‍රී ලංකා මහ බැංකුව
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

**5.3 රූප සටහන**
**ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන සංයුතිය**




කින් වර්ධනය වූ අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මැදපෙරදිග, ජර්මනිය සහ චීනය යන රටවලින් ලැබුන ඉහළ ඉල්ලුම වේ. පොල් කර්මාන්තය නගා සිටුවනු වස්, ආහාරයට ගන්නා තෙල් ආනයන මත, 2005 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි විශේෂිත බද්දක් පනවන ලදී. 2002 ජූලි සිට රබර් මිල ගණන් නොකඩවා ඉහළ ගිය අතර 2004 දී එය සියයට 33 කින් තවදුරටත් ඉහළ ගියේය. දේශීය කාර්මික අංශය වෙතින් රබර් සඳහා ඉල්ලුම ඉහළ යාම නිසා අපනයන සඳහා ඉදිරිපත් කරනු ලැබූ රබර් පරිමාව අඩු වූ අතර එය ප්‍රාථමික නිෂ්පාදනයක් ලෙස රබර් අපනයන ආදායම් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස වූ දේශීය ඉල්ලුම පියවීම සඳහා 2004 දී ස්වාභාවික රබර් මෙට්‍රික් ටොන් 14,256 ක් ආනයනය කරන ලදී.

සුළු කෘෂිකාර්මික අපනයන, 2003 වසරේ වූ සියයට 10 ක තියුණු පහත වැටීමට එරෙහිව, 2004 වසරේදී සියයට 8 කින් වර්ධනය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපෑවේ කරාබු නැටි, එළවළු, කුරුඳු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ඉහළ යාම වේ. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ තීරුබදු රහිතව ඉන්දියානු වෙළෙඳපොළට පිවිසීමේ හැකියාව සහ මැද පෙරදිගින් එළවළු සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම මෙම අංශයට වාසිදායක ලෙස බලපෑවේය. වියළි සහ නැවුම් පළතුරු, බුලත්කොළ සහ වාෂ්පශීලී තෙල් අපනයනවල ඉපැයීම් ඉහළ ගිය අතර, 2004 වසරේදී කෝපි, ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි හා කරදමුංගු නිෂ්පාදන වලින් වූ අපනයන ඉපැයීම් අඩුවිය.

රෙදිපිළි හා ඇඟළුම්, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ඉහළ ක්‍රියාකාරීත්වය, කාර්මික අපනයන, සියයට 13 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් උපකාරී විය. බටහිර රටවල් සමඟ ඇති කරගන්නා ලද වෙළෙඳ සම්බන්ධතා තුළින් විවර වූ වෙළෙඳපොළ ප්‍රවේශයන් මෙම වර්ධනයට බෙහෙවින් ඉවහල්විණි. බහු කෙඳි ගිවිසුම අහෝසිවීමේ අභියෝගය හමුවේ පැවැති දැඩි තරඟකාරීත්වය මධ්‍යයේ වුවද මුළු අපනයනවලින් සියයට 49 කට සහ මුළු කාර්මික අපනයනයෙන් සියයට 62 කට දායක වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන 2004 වසරේ දී සියයට 9 කින් වර්ධනය විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන පරිමාව 2004 වසරේදී සියයට 8 කින් වර්ධනය වූ අතර, අපනයන මිල ගණන් සියයට 1 කින් ඉහළ ගියේය. ඇඟළුම් හා රෙදිපිළි කර්මාන්තය ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළ මත දැඩිව කේන්ද්‍රගත වීමෙන් මතු වී තිබූ අවදානම් තත්ත්වය, යුරෝපීය සංගම් වෙළෙඳ පොළෙහි වූ ප්‍රසාරණයත් සමඟ යම්තාක් දුරට අඩු කර ගැනීමට හැකිවිය. 2004 වසරේ පෙබරවාරි සිට ක්‍රියාත්මක වූ, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ යුරෝපීය සංගමයෙන් ලැබූ විශේෂිත වරප්‍රසාද ඇඟළුම් අපනයන සඳහා වාසිදායක විය. සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් හැරුණු විට, කාර්මික අපනයන වල අනෙකුත් උප කාණ්ඩයන්, 2004 වසර තුළදී තවදුරටත් වර්ධනය විය. 2002 වසරේදී පසුබෑමකට ලක්ව තිබූ ස්වර්ණාභරණ අපනයන, බෙල්ජියම, ඊශ්‍රායලය, වියට්නාමය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජපානය යන ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථාන වලින් ජනිත වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. ස්වර්ණාභරණ නිෂ්පාදනයට අවශ්‍ය රත්‍රං, රිදී, දියමන්ති, මුතු හා මැණික් යන අමුද්‍රව්‍ය ආනයන සඳහා වටිනාකම මත අගය එකතු කිරීමේ බද්දෙන් නිදහස් කිරීම හේතුවෙන් එම භාණ්ඩ නිෂ්පාදකයන්ට වාසිදායක තත්ත්වයක් උදාවිණි.

මැණික් අපනයනය විශාල වශයෙන් ඉහළ යාම නිසා, 2003 වසරේ වූ පහත වැටීමට එරෙහිව, 2004 වසරේ දී ඛනිජ ද්‍රව්‍ය අපනයන සියයට 43 කින් ඉහළ ගිය අතර, මැණික් අපනයන ඛනිජ ද්‍රව්‍ය අපනයනයෙන් සියයට 90 කට දායක විය. 2003 වසරේදී මැණික් කර්මාන්තය ආශ්‍රිතව නොවිසඳී පැවැති ගැටළුවල බලපෑමෙන් ඇති වී තිබූ පසුගාමී තත්ත්වය පහව ගොස්, 2004 වසරේ දී මැණික් අපනයනය සියයට 38ක ප්‍රබල වර්ධනයක් පෙන්නුම් කරමින්, අහිමි වූ වෙළෙඳපොළ නැවත අත් කර ගත්තේය. ශ්‍රී ලංකාව තවදුරටත් ලෝක වෙළෙඳපොළ තුළ විශාලතම නිල් මැණික් සැපයුම්කරු විය. 2004 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම මැණික් ගැනුම්කරු වූ

**5.5 සංඛ්‍යා සටහන**

**ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව වර්ගීකරණය**

එ.ජ. ඩොලර් දශ ලක්ෂ

| කාණ්ඩය | 2003 වටිනාකම | 2003 ප්‍රතිශතය | 2004 (අ) වටිනාකම | 2004 (අ) ප්‍රතිශතය | වටිනාකමෙහි වෙනස (අ) | වර්ධන අනුපාතය(අ) | වර්ධනයට වූ දායකත්වය (අ) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **1,481** | **22** | **1,623** | **20** | **142** | **9.6** | **10.7** |
| ආහාර හා පාන වර්ග | 701 | 11 | 779 | 9 | 78 | 11.1 | 5.8 |
| සහල් | 8 | 0 | 59 | 1 | 51 | 638.0 | 3.8 |
| සීනි | 116 | 2 | 110 | 1 | -6 | -6.0 | -0.5 |
| කිරිඅලි | 137 | 2 | 183 | 2 | 46 | 34.0 | 3.5 |
| වෙනත් | 440 | 7 | 427 | 5 | -13 | -2.9 | -1.0 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 780 | 11 | 844 | 11 | 64 | 8.3 | 4.9 |
| **අන්තර් භාණ්ඩ** | **3,811** | **57** | **4,645** | **58** | **834** | **21.9** | **62.8** |
| ඛනිජ තෙල් | 838 | 13 | 1,209 | 15 | 371 | 44.3 | 28.0 |
| පොහොර | 88 | 1 | 107 | 1 | 19 | 21.6 | 1.5 |
| රසායනික ද්‍රව්‍ය | 170 | 3 | 206 | 3 | 36 | 21.2 | 2.7 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,372 | 21 | 1,514 | 19 | 142 | 10.3 | 10.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 1,343 | 19 | 1,609 | 20 | 266 | 19.8 | 20.0 |
| **ආයෝජන භාණ්ඩ** | **1,320** | **20** | **1,670** | **21** | **350** | **27.0** | **26.3** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 698 | 11 | 857 | 11 | 159 | 22.8 | 12.0 |
| ගමනාගමන උපකරණ | 206 | 3 | 257 | 3 | 51 | 24.8 | 3.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 328 | 5 | 402 | 5 | 74 | 23.0 | 5.5 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 88 | 1 | 154 | 2 | 66 | 75.1 | 5.0 |
| **වර්ග නොකළ ආනයන** | **60** | **1** | **61** | **1** | **1** | **1.7** | **0.1** |
| **මුළු ආනයන (ආ)** | **6,672** | **100** | **8,000** | **100** | **1,327** | **19.9** | **100.0** |
| වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය | 96.52 | | 101.19 | | | | |

(අ) තාවකාලිකයි
(ආ) ගලපන ලදී.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ප්‍රධාන දියමන්ති ආනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

අතර, ඉන් අනතුරුව ප්‍රධානතම ගැනුම්කරුවන් වූයේ ජපානය හා තායිලන්තය වේ. නූතන හැකියාවන්හි උපකාරිත්වයෙන් නව රටා නිර්මාණය කළ හැකි නම් සහ කපා ඔපදමන ලද මැණික් අවශ්‍ය පරිදි සුලභව පවතීනම්, ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ අපනයන ඉපැයීම් තවදුරටත් ප්‍රසාරණය කිරීමේ හැකියාව ඇත.

## ආනයන ක්‍රියාකාරිත්වය

2003 වසරේ සියයට 9 කින් වර්ධනය වූ ආනයන පිරිවැය, ආර්ථිකයේ ඇති වූ ප්‍රසාරණය, නොකඩවා පැවති නියඟය හා තියුණු ලෙස ඉහළ ගිය තෙල් මිල ගණන් සහ පසුගිය වකවානුවේ පැවති අඩු පොලී අනුපාතිකයන් පිළිබිඹු කරමින්, 2004 දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,000 දක්වා සියයට 20 කින් වර්ධනය විය. ආර්ථිකයේ ඇති වූ ප්‍රසාරණය සමඟ ආයෝජන සහ අන්තර් භාණ්ඩ ආනයනය වර්ධනය වූ අතර, නියඟයෙහි වූ බලපෑම නිසා ආහාර ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් ආනයන ඉහළ ගියේය.

1977 පසුව නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීමත් සමඟ මුළු ආනයන තුළ පාරිභෝගික භාණ්ඩ ආනයනවල දායකත්වය ක්‍රමයෙන් අඩුවෙමින් ආයෝජන හා අන්තර් භාණ්ඩ ආනයනයන්හි දායකත්වය ක්‍රමිකව වැඩි වෙමින් පවතී. 2004 වසරේදී පාරිභෝගික භාණ්ඩ ආනයන, සියයට 20 දක්වා තවදුරටත් පහත වැටුණු අතර, අන්තර් සහ ආයෝජන භාණ්ඩ ආනයනවල දායකත්වය පිළිවෙළින් සියයට 58 සහ සියයට 21 දක්වා ඉහළ ගියේය.

2004 වසරේ පාරිභෝගික භාණ්ඩ ආනයන පිරිවැය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,623 ක් දක්වා සියයට 10 කින් වර්ධනය විය. දේශීය නිෂ්පාදනය පහත වැටීම හා 2004 සැප්තැම්බර් මස සිට සහල් කිලෝවක ආනයන මත පනවා තිබූ රු. 9.00 ආනයන බද්ද ඉවත් කිරීමත් සමඟ ප්‍රධාන ආහාර ද්‍රව්‍යය වූ සහල් ආනයන ඉහළ ගියේය. සුළු වශයෙන් පහත වැටුණු මෝටර් රථ ආනයන හැර අනිකුත් කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ වූ අනිකුත් කාණ්ඩවල ආනයන ඉහළ ගියේය. 2003 ප්‍රථම කාර්තු තුන සමඟ සසඳන විට, 2004 ප්‍රථම කාර්තු තුනහිදී මෝටර් රථ ආනයන සියයට 12 කින් ඉහළ ගියේය. එසේ වුවද 2004 ඔක්තෝබර් මස 22 වැනි දින සිට ඉහළ නංවන ලද විශේෂිත බදු සහ ණයවර ලිපි ආවරණය වන පරිදි පනවනු ලැබූ සියයට සියයක මුල්‍යමය ආවරණය හේතුවෙන් පුද්ගලික පරිහරණය සඳහා ආනයනය කළ මෝටර් රථ ප්‍රමාණය 2004 අවසන් කාර්තුවේදී තියුණු ලෙස පහත වැටුණි.

ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඛනිජ තෙල් වලින් සමන්විත අන්තර් භාණ්ඩ ආනයන සියයට 22 කින් ඉහළ ගියේය. 2003

### 5.4 රූප සටහන
### ප්‍රධාන කාණ්ඩ අනුව ආනයන සංයුතිය

**1977**




**2004**




### 5.6 සංඛ්‍යා සටහන
### ප්‍රධාන ආනයන පරිමාවන් (අ)

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2000 | 2001 | 2002 | 2003 | 2004(ආ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **15** | **52** | **95** | **35** | **222** |
| 1 වන කාර්තුව | 7 | 3 | 51 | 22 | 9 |
| 2 වන කාර්තුව | 7 | 7 | 9 | 9 | 9 |
| 3 වන කාර්තුව | ... | 2 | 10 | 2 | 4 |
| 4 වන කාර්තුව | 1 | 40 | 25 | 2 | 200 |
| **තිරිඟු** | **922** | **760** | **993** | **919** | **993** |
| 1 වන කාර්තුව | 266 | 231 | 309 | 262 | 257 |
| 2 වන කාර්තුව | 210 | 229 | 215 | 232 | 218 |
| 3 වන කාර්තුව | 247 | 177 | 221 | 217 | 189 |
| 4 වන කාර්තුව | 199 | 123 | 248 | 208 | 329 |
| **සීනි** | **562** | **420** | **554** | **509** | **438** |
| 1 වන කාර්තුව | 128 | 100 | 146 | 151 | 98 |
| 2 වන කාර්තුව | 185 | 127 | 141 | 135 | 173 |
| 3 වන කාර්තුව | 85 | 109 | 110 | 104 | 71 |
| 4 වන කාර්තුව | 164 | 84 | 157 | 119 | 96 |
| **ඛණිජ තෙල් (බොර තෙල්)** | **2,347** | **1,954** | **2,300** | **1,995** | **2,200** |
| 1 වන කාර්තුව | 608 | 237 | 539 | 382 | 586 |
| 2 වන කාර්තුව | 583 | 539 | 513 | 466 | 464 |
| 3 වන කාර්තුව | 613 | 624 | 593 | 500 | 634 |
| 4 වන කාර්තුව | 543 | 554 | 655 | 647 | 516 |
| **පිරිපහදු ඛනිජ තෙල්** | **1,257** | **1,420** | **1,348** | **1,168** | **1,259** |
| 1 වන කාර්තුව | 327 | 537 | 276 | 340 | 399 |
| 2 වන කාර්තුව | 293 | 419 | 426 | 239 | 323 |
| 3 වන කාර්තුව | 321 | 224 | 266 | 317 | 275 |
| 4 වන කාර්තුව | 316 | 240 | 380 | 272 | 262 |
| **රෙදිපිළි** | **239** | **234** | **244** | **253** | **257** |
| 1 වන කාර්තුව | 61 | 60 | 57 | 61 | 58 |
| 2 වන කාර්තුව | 63 | 63 | 65 | 65 | 66 |
| 3 වන කාර්තුව | 57 | 52 | 61 | 58 | 66 |
| 4 වන කාර්තුව | 58 | 59 | 61 | 68 | 66 |
| **පොහොර** | **559** | **460** | **537** | **514** | **510** |
| 1 වන කාර්තුව | 149 | 66 | 103 | 124 | 54 |
| 2 වන කාර්තුව | 102 | 183 | 163 | 166 | 164 |
| 3 වන කාර්තුව | 174 | 83 | 138 | 49 | 76 |
| 4 වන කාර්තුව | 134 | 128 | 133 | 175 | 216 |

(අ) ගලපන ලදි
(ආ) තාවකාලිකයි

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
පීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

වසරේ එ.ජ.ඩොලර් 29.46 ක් වූ බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල, 2004 වසරේදී එ.ජ.ඩොලර් 37.48 දක්වා ඉහළ යැම ආනයන පිරිවැය ඉහළ යාමට හේතු විය. බොරතෙල් ආනයන, පිරිපහදු කිරීමේ නිෂ්පාදන ධාරිතාව මගින් සීමා කරන ලදි. එසේ හෙයින් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වූ ඉහළ ඉල්ලුම පිරිපහදු නිෂ්පාදන ආනයන මගින් සපුරා ගන්නා ලදී. රෙදිපිළි හා ඇඟළුම් අපනයන තියුණු ලෙස ඉහළ යාම නිසා එහි ප්‍රධාන අමුද්‍රව්‍ය වන රෙදිපිළි ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කඩදසි, රසායනික ද්‍රව්‍ය, ස්වර්ණාභරණ, බේකරි සහ රබර් පදනම් කරගත් නිෂ්පාදන වැනි අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයන සියයට 15 කින් ඉහළ ගියේය.

ආර්ථිකයේ ඇති වූ ප්‍රසාරණය සහ අඩු පොළී අනුපාතික වාතාවරණය මගින් නිර්මාණය වූ වාසිදායක තත්ත්වය හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර උපකරණ ඇතුළත් වූ ආයෝජන භාණ්ඩ ආනයන, 2004 දී සියයට 27 කින් ඉහළ ගියේය. ආයෝජන භාණ්ඩ ආනයන තුළ අඩකට වඩා වැඩි ප්‍රමාණයකින් සමන්විත වන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයන කාණ්ඩය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, විදුලි ජනක උත්පාදන යන්ත්‍ර, පණිවුඩ හුවමාරු යන්ත්‍ර, දත්ත සැකසුම් යන්ත්‍ර, විදුලි පණිවුඩ උපකරණ සහ මහන මැෂින් යනාදියෙන් සමන්විත වූ අතර, 2004 වසරේ එම ආනයන සියයට 23 කින් ඉහළ ගියේය. වර්ධනය වෙමින් පවත්නා විදුලි සංදේශ අංශය, නවීන විදුලි සංදේශ උපකරණ සහ පණිවුඩ හුවමාරු යන්ත්‍ර සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කළේය. සංචාරක පැමිණීම්වල ඇති වූ විශාල වර්ධනයත් සමඟ හෝටල් කර්මාන්තයේ ඇති වූ පිබිදීම සහ ඉදිකිරීම් කර්මාන්තයෙහි ඇති වූ ප්‍රසාරණය නිසා මෙම ක්ෂේත්‍රවලට අදාල ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය, ගොඩනැගිලි ද්‍රව්‍ය කාණ්ඩයේ ආනයන ඉහළ යාමට හේතු විය.

**5.5 රූප සටහන**
**වෙළෙඳ දිශාව - 2004**

**5.5.1 රූප සටහන**
**අපනයන වෙළෙඳ දිශාව**




**5.5.2 රූප සටහන**
**ආනයන වෙළෙඳ දිශාව**




## වෙළෙඳ දිශාව

2004 වසරේදී වෙළෙඳ දිශාව බොහෝ දුරට නොවෙනස්ව පැවතිණි. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ප්‍රමුඛ කාර්මික රටවල් තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගැනුම්කරු විය. 1979 වසරේ සිටම ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම ගැනුම්කරු වූ අතර, රෙදිපිළි හා ඇඟළුම් අපනයන වලින් සියයට 58 කට දායකත්වය සපයමින් රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදනවල ප්‍රධානම වෙළෙඳපොල විය. කෙසේ වෙතත්, අනෙකුත් රටවල් සමඟ අපනයන සම්බන්ධතා පුළුල් වීමත් සමඟ ඇමෙරිකා එක්සත් ජනපදයේ දායකත්වය පෙර වසරේ පැවැති සියයට 35 මට්ටමේ සිට 2004 වසරේදී සියයට 32 දක්වා පහත වැටුණි. යම් තාක්දුරට ඉහළ මට්ටමක පැවැති තීරුබදු, අනෙකුත් බොහෝ දියුණු වෙමින් පවත්නා රටවලට ලබා දුන් සහනදායි බදු අනුපාතිකයන් හා අනෙකුත් රෙදිපිළි අපනයන කරන රටවලින් ඇති වූ තරඟකාරීත්වය, ඇමෙරිකා එක්සත් ජනපදය වෙත යැවුන අපනයන ප්‍රමාණය අඩු වීමට හේතු විය. ශ්‍රී ලංකා අපනයනවලට අදළ ඇමෙරිකා එක්සත් ජනපදයේ තීරුබදු ප්‍රමාණය සියයට 0 සිට 28ක පරාසයක පැවතුනි. එම නිසා ශ්‍රී ලංකාව, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ පැවති වෙළෙඳ හා ආයෝජන සඳහා වන මූලික ගිවිසුම, නිදහස් වෙළෙඳ ගිවිසුමක් දක්වා වර්ධනය කිරීමට සාකච්ඡා කරමින් සිටී.

තවදුරටත් එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන ගැනුම්කරු වූ අතර, එහි දායකත්වය මුළු අපනයන වලින් සියයට 14 ක් විය. රෙදිපිළි හා ඇඟළුම්, එක්සත් රාජධානිය වෙත අපනයනය කරන ලද ප්‍රධාන ද්‍රව්‍ය වූ අතර, එය මුළු ඇඟළුම් අපනයන වලින් සියයට 23 ක් විය. මීට අමතරව තේ සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ද, එක්සත් රාජධානිය ප්‍රධාන වෙළෙඳපොළක් විය.

ඉන්දු-ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුමෙන් ලද සහන 2004 වසරේදී, ඉන්දියාව සමඟ පැවති වෙළෙඳ සබඳතා තියුණු ලෙස වැඩිවීමට ඉවහල් විය. 2000 වසරේ ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීමත් සමඟම ඉන්දියාවට ශ්‍රී ලංකාවෙන් කෙරෙන අපනයන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. 2003 වසරේදී සියයට 5 ක් වූ අපනයන දායකත්වය වූ 2004 සියයට 7 ක් දක්වා වර්ධනය විය. ඉන්දියාවට අපනයනය කළ ප්‍රධාන භාණ්ඩ අතර, පිරිපහදු කරන ලද තඹ, විද්‍යුත් සන්නායක, වානේ සුන්බුන්, ගම්මිරිස්, කපාපු පොල් සහ ආවරණය කළ විදුලි රැහැන් ඇතුළත් විය.

ශ්‍රී ලංකාවේ අපනයන සඳහා අනෙකුත් ප්‍රධාන වෙළෙඳපලවල් වූයේ ජර්මනිය, බෙල්ජියම සහ ලක්සම්බර්ග්, ජපානය, ඉතාලිය, රුසියාව, සහ එක්සත් ආරාබි එමීර් රාජ්‍ය ආදී රටවල වේ. ජර්මනියට යවන ලද ප්‍රධාන අපනයන අතර රෙදිපිළි, තේ, පෙරසවි ටයර්, අත් වැසුම් සහ කොහු කෙඳි නිෂ්පාදන ඇතුළත් විය. බෙල්ජියම සහ ලක්සම්බර්ග් වලට යවන ලද අපනයනය අතර දියමන්ති සහ ඇඟළුම් ප්‍රධාන තැනක් ගත්තේය. බටහිර රටවල් වලට අපනයනය කළ වෙනත් ප්‍රධාන අපනයන අතර වටිනා මැණික් වර්ග, අත්වැසුම්, ටයර්, පොල් අතුරු නිෂ්පාදන, ඉස්සන් හා මත්ස්‍ය නිෂ්පාදිත, ප්‍රතිමා සහ විසිතුරු භාණ්ඩ ඇතුළත් විය. ඉස්සන් අපනයන අඩුවීම හේතුවෙන් ජපානයට යවන ලද අපනයන ප්‍රමාණය අඩුවිය. ඉස්සන් ඇති කරන ගොවිපළවල පැතිරුණු බැක්ටීරියා ආසාදන සහ අකාර්යක්ෂම කළමනාකරණය ඉස්සන් ගොවිපළවල පළදාව අඩු වීමට හේතු විය.

රටවල් කාණ්ඩයක් ලෙස ගත්කළ, ආසියානු රටවල් ආනයන සම්බන්ධයෙන් ප්‍රධාන ස්ථානයක් ගත්තේය. මෙම රටවල් සමස්ත ආනයනවලට 2002 වසරේදී සියයට 53 කින් දායක වූ අතර, එහි දායකත්වය 2003 දී සියයට 56 දක්වාත්, 2004 දී සියයට 57 දක්වාත් වැඩි විය. 2004 දී මෙම රටවලින් කළ ආනයන සඳහා වන පිරිවැය සියයට 21 කින් වර්ධනය විය. සාර්ක් රටවල් සමඟ පැවති වෙළඳම සලකා බැලීමේදී එය මුළු අපනයන වලින් සියයට 9 කට සහ මුළු ආනයන වලින් සියයට 20 කට දායක විය. යුරෝපා සංගමයේ රටවල් 2004 දී සමස්ත ආනයනයෙන් සියයට 15 කට දායක විය.

ඉන්දියාව, ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයන කරන විශාලතම රට වූ අතර (සියයට 18) අනෙකුත් ප්‍රධාන රටවල් අතර හොංකොං ඇතුළත් චීනය (සියයට 14), සිංගප්පූරුව (සියයට 9) සහ ඉරානය (සියයට 5) විය. ඉන්දියාවෙන් ආනයන කළ භාණ්ඩවල වටිනාකම සියයට 34 කින් ඉහළ ගිය අතර, ඖෂධීය නිෂ්පාදිත, තිරිඟු ඇට, සහල්, සහ කපු නූල් ප්‍රධාන ආනයන භාණ්ඩ විය. 2003 වසරේදීත් එ.ජ. ඩොලර් දශලක්ෂ 828ක් වූ ඉන්දියාව සමඟ වෙළෙඳ හිඟය, 2004 වසරේදී එ.ජ. ඩොලර් දශලක්ෂ 1,048 දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර වෙළෙඳ සම්බන්ධතාවයන්, ආනයන සහ අපනයන වටිනාකම අතින් සියයට 1 ක් වැනි සුළු ප්‍රමාණයක් වුවද, පෙර වසරට වඩා 2004 වසරේ දී එය ඉමහත් ලෙස වර්ධනය විය.

**5.7 සංඛ්‍යා සටහන**

**ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම (අ)**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 2003 | 2004 (ආ) | 2003 | 2004(ආ) |
| 1. ප්‍රවාහනය | 201 | 209 | 19,423 | 21,201 |
| 2. සංචාරක | 162 | 217 | 15,628 | 22,232 |
| 3. විදුලි සංදේශ සේවා | 45 | 33 | 4,380 | 3,304 |
| 4. පරිගණක සහ තොරතුරු සේවා | 65 | 72 | 6,274 | 7,286 |
| 5. ඉදිකිරීම් සේවා | 34 | 20 | 3,329 | 2,012 |
| 6. රක්ෂණ සේවා | 19 | 20 | 1,827 | 2,024 |
| 7. වෙනත් ව්‍යාපාරික සේවා | -117 | -137 | -11,292 | -13,798 |
| 8. රජයේ වියදම් (අන් තැනක සඳහන් නොවන) | -11 | -15 | -1,126 | -1,527 |
| **මුළු සේවා** | **399** | **419** | **38,443** | **42,735** |
| 1. සේවක වන්දි ගෙවීම | -5 | -6 | -530 | -601 |
| 2. සෘජු ආයෝජන ආදායම් | -89 | -92 | -8,612 | -9,303 |
| 3. පොලී සහ අනෙකුත් ගෙවීම් | -77 | -106 | -7,393 | -10,784 |
| **මුළු ආදායම** | **-172** | **-204** | **-16,535** | **-20,688** |
| 1. පෞද්ගලික | 1,205 | 1,350 | 116,350 | 136,672 |
| 2. මධ්‍යම ආණ්ඩුව | 36 | 30 | 3,441 | 3,038 |
| **මුළු ජංගම සංක්‍රාම** | **1,241** | **1,380** | **119,790** | **139,710** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම ඉදිරිපත් කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංශෝධනයට (1993) අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට පැසදෙන ලෙස ඉදිරිපත් කර ඇත.

(ආ) තාවකාලික

## 5.4 සේවා ආදායම්, සංක්‍රාම සහ ජංගම ගිණුමේ ශේෂය

ප්‍රවාහන, සංචාරක සහ වෙනත් ව්‍යාපාර සේවා ආදිය සේවා වෙළෙඳමෙහි ප්‍රධාන අංශ වූ අතර පරිගණක සහ තොරතුරු, විදුලි සංදේශ, ඉදි කිරීම් සහ රක්ෂණ සේවා වර්ධනය වෙමින් පවතින වැදගත් අංශ විය. 2004 වසරෙහි සේවා ගිණුමෙහි අතිරික්තය සියයට 5කින්, එ.ජ.ඩොලර් දශලක්ෂ 419 දක්වා වර්ධනය විය.

### ප්‍රවාහන සේවා

සංචාරක පැමිණීම් වාර්තාගත ලෙස ඉහළයාම සහ බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම වැඩිවීම හේතුවෙන් වරාය ආශ්‍රිත කටයුතු වර්ධනය වීම තුළින් මඟී ගාස්තු, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු සහ වරාය ආශ්‍රිත සේවාවන්ගේ ලැබීම් ඉහළ යාම, මඟී ගාස්තු, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු සහ වරාය ආශ්‍රිත ඉපැයීම් ඇතුළත් ප්‍රවාහන සේවාවන්හි ශුද්ධ ලැබීම් 2004 වසරේදී සියයට 11කින් වර්ධනය විය. අපනයන වර්ධනය අභිබවා ආනයන වැඩිවීම සහ විදේශගතවන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය ඉහළයාම පෙන්නුම් කරමින්, ප්‍රවාහන සේවා සඳහා ගෙවීම් සියයට 15කින් වැඩි විය. එසේ වුවද, ප්‍රවාහන සේවාවන්හි ශුද්ධ ලැබීම්, 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 209 දක්වා සියයට 4කින් වැඩි විය.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්ත ඉතිහාසයේ මෙතෙක් වූ ඉහළම සංචාරක පැමිණීම් ප්‍රමාණය එනම්, 566,200 පමණ සංචාරකයින් 2004 වසරේදී පැමිණියේය. 2003 වසරේදී, එ.ජ. ඩොලර් දශලක්ෂ 340ක් වූ සංචාරක ඉපැයීම් ප්‍රමාණය 2004 වසරේ දී එ.ජ. ඩොලර් දශලක්ෂ 413 දක්වා වර්ධනය විය. අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ පැමිණීම් ද ඇතුළුව මුළු සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් දශලක්ෂ 513 දක්වා සියයට 10 කින් වර්ධනය විය. ශ්‍රී ලාංකිකයන්, වැඩි වශයෙන් විදේශ චාරිකා තෝරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, දළ සංචාරක වියදම්ද එ.ජ. ඩොලර් දශලක්ෂ 296 දක්වා සියයට 6 කින් වැඩිවිය.

**5.6 රූප සටහන**

**මාසික සංචාරක පැමිණීම්**



**5.8 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛණ: 2000-2004**

| ශීර්ෂය | 2000 | 2001 | 2002 | 2003(අ) | 2004(ආ) | ප්‍රතිශත වෙනස 2003(අ) | ප්‍රතිශත වෙනස 2004(ආ) |
|---|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | 400,414 | 336,794 | 393,171 | 500,642 | 566,202 | 27.3 | 13.1 |
| සංචාරක රාත්‍රී ගණන (දහස්) | 4,056 | 3,342 | 3,989 | 5,093 | 5,742 | 27.7 | 12.8 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 52.3 | 42.1 | 43.1 | 53.2 | 59.3 | 23.4 | 11.5 |
| දළ සංචාරක ලැබීම් (රු. දශ ලක්ෂ) | 19,162 | 18,863 | 24,202 | 32,810 | 41,790 | 35.6 | 27.3 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 47,855 | 56,008 | 61,556 | 65,536 | 73,808 | 6.5 | 13.3 |
| මුළු සේවා නියුක්තිය | 91,063 | 80,904 | 93,170 | 112,226 | 129,038 | 20.5 | 15.0 |
| සෘජු | 37,943 | 33,710 | 38,821 | 46,761 | 53,766 | 20.5 | 15.0 |
| වක්‍ර | 53,120 | 47,194 | 54,349 | 65,465 | 75,272 | 20.5 | 15.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 50ක දායකත්වයක් සහිතව බටහිර යුරෝපය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක උත්පාදන කලාපය වූ අතර, 2004 එම කලාපයේ සංචාරක පැමිණීම් සියයට 13කින් වර්ධනය විය. මුළු පැමිණීම්වලින් සියයට 35ක දායකත්වයක් සහිතව දෙවන විශාලතම සංචාරක උත්පාදන කලාපය වූ ආසියාවද, ඒ හා සමාන වර්ධන වේගයක් වර්තා කළේය. ඉන්දියාව ප්‍රමුඛ කර ගත් ආසියාවෙන් වූ සංචාරක පැමිණීම් සියයට 12 කින් ඉහළ ගිය අතර, එය 2004 වසරේදී මුළු පැමිණීම්වලින් සියයට 35කට දායක විය. 2004 වසරේ දී ඕස්ට්‍රේලියාව, උතුරු ඇමෙරිකාව, මැදපෙරදිග සහ නැගෙනහිර යුරෝපයේ පැමිණීම්වල ද කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.

දිවයිනට ගොඩබැසීමේ දී අය කරන ගුවන් තොටුපළ ආගමන බද්දෙන් තුනෙන් එකක් සහ සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි සංචාරක ආයතනවල මුළු පිරිවැටුමෙන් සියයට 1ක බද්දෙන් ලද ආදායම, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි ප්‍රචාරාත්මක ක්‍රියාකාරකම් සහ මානව සම්පත් සංවර්ධනය සඳහා යොමු කළේය. දිවයිනට ගොඩබැසීමේ දී අය කළ ගුවන් තොටුපළේ ආගමන බද්දෙන් සහ සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි සංචාරක ආයතනවලින් වූ සියයට 1ක පිරිවැටුමෙන් එකතුකළ බදු ප්‍රමාණ පිළිවෙලින්, රු. දශලක්ෂ 439ක් සහ රු.දශලක්ෂ 301 ක් විය. රටේ ප්‍රතිරූපය නැවත ගොඩනඟනු වස් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක අමාත්‍යාංශය සමඟ එක්ව "නැවත ගොඩනැගෙනු ශ්‍රී ලංකා" නමින් විශේෂිත ප්‍රවර්ධන ව්‍යාපාරයක් නිරාවරණයක කරන ලදී.

### විදුලි සංදේශ සේවා සහ තොරතුරු තාක්ෂණ සේවා

2003 අප්‍රේල් මස දී ජාත්‍යන්තර පිවිසුම් පද්ධතිය ලිහිල් කිරීමත් සමඟ අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ විදුලි සංදේශ සේවාවන්හි ශුද්ධ ඉපැයීම්, ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර ඇමතුම් ලබා ගැනීම ඉහළ යාම හේතුවෙන් එ.ජ.ඩොලර් දශලක්ෂ 33 දක්වා සියයට 29කින් අඩු විය. තරඟකාරිත්වය ඉහළයාමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශ රටවලින් ජාත්‍යන්තර ඇමතුම් ලබා ගැනීමේ වියදමට වඩා ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර ඇමතුම් ලබා ගැනීමේ වියදම අඩු විය. දියුණු සංනිවේදන පද්ධතියක් පැවතීම ආර්ථිකයේ අනෙකුත් කොටස්වල ඵලදායීතාවය වැඩි දියුණු කිරීමට හේතුවන බැවින් මෙය ලිහිල්කරණ ක්‍රියාවලියේ මුල් අවධියේදී දකිය හැකි අයහපත් ලෙස සැලකිය නොහැකි සාමාන්‍ය සිදුවීමකි. මෙම අඩුවීමට හේතුවිය හැකි අනෙකුත් කරුණු වන්නේ අන්තර් ජාලය, ෆැක්ස් සහ විද්‍යුත් සන්නිවේදනය භාවිතා කිරීම ඉහළ යාමය.

මේ අතර, පරිගණක සහ තොරතුරු සේවාවන්හි ශුද්ධ ඉපැයීම් 2004 වසරේදී සියයට 11කින් වර්ධනය වී එ.ජ.ඩොලර් දශලක්ෂ 72ක් විය. කෙසේ වෙතත්, දනට ප්‍රාථමික මට්ටමක පසුවන මෙම අංශයේ විදේශ විනිමය ඉපැයීම් තුළින් පෙන්නුම් කරනුයේ ඉදිරියේදී විශාල වර්ධන හැකියාවක් ඇති බවයි. මේ සම්බන්ධයෙන් නිපුණතා සංවර්ධනය අඛණ්ඩව පවත්වාගැනීම, විශ්වසනීය සම්බන්ධතාවයන් තහවුරු කරමින් විදුලි සංදේශ සේවා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ වේගවත් සම්ප්‍රේෂණය තොරතුරු තාක්ෂණ අපනයන අංශයේ අනාගත වර්ධනය සඳහා අවශ්‍ය මූලික සාධක වේ.

### ආදායම් ලැබීම් සහ ගෙවීම්

වර්ෂය තුළදී නිල සංචිත සැලකිය යුතු අන්දමින් පහළ ගියද, ඉහළ ගිය ජාත්‍යන්තර පොලී අනුපාත සහ මහ බැංකුව විසින් නිල විදේශ විනිමය සංචිත කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන් නිල විදේශ සංචිත ආයෝජනය කිරීමෙන් ඉපැයූ පොලී ආදායම් සහ වෙළඳ ලාභ 2004 වසරේදී සියයට 16කින් ඉහළ ගියේය. 2003 වසරේ තිබුණු අවප්‍රමාණය සමඟ සසඳන විට 2004 වසරේ අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව, එ.ජ.ඩොලරයේ අඩු අවප්‍රමාණය නිසා අගය පිළිබඳ ගැලපීම් වලින් ලැබුණු වාසිය සුළු වශයෙන් අඩුවිය. නිල සංචිත තුළින් ලැබූ ආදායමේ වැඩිවීමට අමතරව වාණිජ බැංකුවල ඇති විදේශ විනිමය සංචිත තුළින් ලැබෙන ආදායම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් දළ විදේශ විනිමය සංචිත මත පොලී ආදායම් ඉහළ ගියේය. විදේශ ණය මත ඉහළ පොලී ගෙවීම් සහ විදේශ ආයෝජකයන් සහ කොටස් හිමියන් සඳහා විදේශයන්ට යැවූ ලාභ හා ලාභාංශ වැඩිවීම හේතුවෙන්, 2004 වසරේ ආදායම් ගලායාම සියයට 6කින් වැඩි විය. ඒ අනුව නිරපේක්ෂ

වශයෙන් ආදයම් ගෙවීම් ආදයම් ලැබීම්වලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගිය බැවින් 2004 වසරේදී ආදයම් ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් දශලක්ෂ 204 දක්වා සියයට 19කින් පුළුල් විය.

**ජංගම සංක්‍රාම**

සංක්‍රාම ගිණුමේ ශුද්ධ ගලාඒම් පුළුල්වන වෙළෙඳ හිඟය, මූල්‍යනය කිරීමේ ප්‍රධානතම මූලාශ්‍රය වශයෙන් තවදුරටත් පැවතුණි. 2004 වසරේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශලක්ෂ 1,564 දක්වා සියයට 11කින් වර්ධනය වූ අතර, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව ඉහළ යාමද මෙයට එක් හේතුවක් විය. රැකියා සඳහා විදේශ ගතවන සංඛ්‍යාව 2004 වසරේ දී 213,114 දක්වා සියයට 2කින් වර්ධනය විය.

මුළු පෞද්ගලික සංක්‍රාමවලින් සියයට 56කට දයකවූයේ මැදපෙරදිග කලාපයයි. මැදපෙරදිග කලාපයේ රැකියා සඳහා යොමු වූ ශ්‍රමික සංඛ්‍යාව ඉහළ ගිය ද, එම කලාපයේ ඉපැයීම්වල සාපේක්ෂ ප්‍රමාණය 2000 වසරේ සිට ක්‍රමයෙන් පහත වැටුණු අතර, එයට හේතු වූයේ යුරෝපා කලාපයේ සාපේක්ෂව ඉහළ වැටුප් ගෙවන රැකියා අවස්ථාවන් වැඩිවීමයි. බටහිර ආසියානු රටවලට තවදුරටත් බඳවා ගැණුනේ වැඩි වශයෙන් ගෘහ සේවිකාවන් ඇතුළු නුපුහුණු ශ්‍රමිකයන්ය.

පසුගිය වසර 5 මුළුල්ලේ අඛණ්ඩව වර්ධනය වූ යුරෝපා සංගමයට අයත් රටවලින් ලැබුණු සංක්‍රාම ආදයම 2004 වසරේදී මුළු සංක්‍රාම ඉපැයීම්වලින් සියයට 18කට පමණ දයක විය. පිළිවෙලින් සියයට 8කින්, සියයට 7කින් සහ සියයට 5කින් මුළු සංක්‍රාමවලට දයක වූ අනෙකුත් ප්‍රධාන රටවල් වූයේ අනෙකුත් යුරෝපා රටවල්, උතුරු ඇමෙරිකාව, සහ ඈත පෙරදිග රටවල්ය.

අපනයන ආදයම් හැරුණු විට, විදේශ විනිමය ඉපැයීම් සඳහා තනි විශාලම දයකත්වය සැපයූ පෞද්ගලික සංක්‍රාම, ජංගම ගිණුමේ වෙළෙඳ හිඟය සැලකිය යුතු ලෙසින් පියවීමට දයක විය. අවිධිමත් මාර්ග තුළින් පෞද්ගලික සංක්‍රාම සැලකිය යුතු ප්‍රමාණයක් තවමත් රට තුළට ලැබෙන බව වාර්තා වේ. මුදල් එවීමේ පහසුකම් ගම්බද බැංකු ශාඛාවලට ව්‍යාප්ත කිරීම සහ අදළ බැංකු ගාස්තු ක්‍රමවත් කිරීම තුළින් මෙම මුදල් විධිමත් මාර්ගයන්ගෙන් රට තුළට ගෙන්වාගත හැකිය. මෙයට පිළියමක් ලෙස විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් ආරම්භ කිරීමටත්, මුදල් ප්‍රේෂණය කිරීමටත් අවසර ලබා දී ඇත. මීට අමතරව 2005 අයවැය යෝජනාවක් ලෙස රාජ්‍ය බැංකු හරහා රට තුළට මුදල් එවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් හට නිවාස ණය පහසුකම් වැනි සහන කිහිපයක් ම හඳුන්වා දී ඇත.

විදේශීය ප්‍රදනයන් ලැබීම පහළ යාම නිසා රටට ලැබෙන විදේශ ආධාර වන ආහාර, භාණ්ඩ ආධාර, මුදල් ආධාර හා තාක්ෂණික සහයෝගවලින් සමන්විත නිල ජංගම සංක්‍රාම

**5.7 රූප සටහන**

**නිල සහ පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම්**




2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 30 දක්වා සියයට 17 කින් අඩු විය.

## 5.5 ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්, සහ ගෙවුම් තුලනය

**ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්**

ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම්වල ඒකාබද්ධ අතිරික්තය ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කරනු ලබයි. ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමෙන් පසු ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්වල හිඟයක් හෝ අතිරික්තයක් වේ නම් එයින් සමස්ත ගෙවුම් ශේෂයේ හිඟයක් හෝ අතිරික්තයක් පෙන්නුම් කරනු ලබයි. රජයට ආධාර දෙන ආයතන මගින් ලබා දෙන ප්‍රාග්ධන ප්‍රදානයන් ප්‍රාග්ධන ගිණුමේ පෙන්නුම් කරන අතර, එය 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 64 දක්වා සියයට 14කින් අඩු විය. 2003 වසරේ මූල්‍ය ගිණුමේ පෙන්නුම් කරන ලද එ.ජ.ඩොලර් දශලක්ෂ 648ක් වූ අතිරික්තය සමඟ සසඳන විට 2004 වසරේ එය එ.ජ.ඩොලර් දශලක්ෂ 572 දක්වා අඩු විය. නිල ප්‍රදනයන් සහ ණය ආධාර ගලාඒම් අඩුවීම, ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්වල අතිරික්තය අඩුවීමට ප්‍රධාන හේතුවක් විය. පෞද්ගලික අංශයට ලැබුණු විදේශ සෘජු ආයෝජන, ණය සහ විවිධ ආයෝජන හේතුවෙන් මෙම අඩුවීම මඳ වශයෙන් සමනය කිරීමට හැකි විය.

**විදේශීය සෘජු ආයෝජන**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කලින් එළඹුණු ගිවිසුම් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම නිසා, 1997 වසරට පසුව රටට ලැබුණු වැඩිම විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය වාර්තා කරමින් 2004 වසරේදී පෞද්ගලීකරණ ලැබීම් ඇතුළත් සෘජු ආයෝජන එ.ජ.ඩොලර් දශලක්ෂ 233 දක්වා සියයට 2 කින් වැඩි විය. කෙසේ වෙතත් මැතිවරණයට පසුව ඇති වූ දේශපාලන අස්ථාවරත්වයත්, ආයෝජනවල ගුණාත්මක බව සහ ඵලදයී බව තහවුරු කිරීම සඳහා වඩා සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමුවීමත් හේතුවෙන් 2004 වසරේදී සෘජු ආයෝජන අනුමත කිරීම් සහ එකඟතාවයන් අඩු විය. කෙසේ වෙතත්, මෙම

ඒකඟතාවයන් අඩු වුවත්, දැනටමත් තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ ප්‍රවනතාවය වැඩි නිසා අනාගතයේදී විදේශීය සෘජු ආයෝජන අඩු විය නොහැක. සේවා අංශයේ විදේශීය සෘජු ආයෝජන ලැබීම් සියයට 47.7ක ඉහළම අගයක් වාර්තා කරමින්, නැගී එන ජාත්‍යන්තර ප්‍රවනතාව අනුව නිෂ්පාදන අංශයේ සිට සේවා මුල් කරගත් කර්මාන්ත තුළ ආයෝජනය කිරීමට වැඩි නැඹුරුවක් දක්වූ බව පෙන්නුම් කරයි. ඒ ඒ අවස්ථාවලදී අවසර ගතයුතු වූ නිසා වසර තුළ සෘජු ආයෝජන ගලා යාම් එ.ජ.ඩොලර් දශලක්ෂ 6ක පමණ පහළ මට්ටමක නොවෙනස්ව පැවැතිණ.

## පෞද්ගලීකරණ ලැබීම්

2004 වසරේ දී ඉන්දියානු තෙල් සමාගමෙන් ලැබිය යුතු පෞද්ගලීකරණ ලැබීම් වශයෙන් එ.ජ.ඩොලර් දශලක්ෂ 10ක් ලැබුණු අතර, එය 2003 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 30ක් විය. 2004 වසරේදී විදේශ මූලාශ්‍රයන්ගෙන් ඉහළ පෞද්ගලීකරණ ලැබීම් ප්‍රමාණයක් අපේක්ෂා කළ ද, ඛනිජ තෙල් සංස්ථාවේ වත්කම්වලින් කොටසක් මෙන්ම වෙනත් රාජ්‍ය අංශයේ ආයතන කිහිපයක් ද පෞද්ගලීකරණය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂිත ලැබීම් ප්‍රමාණය රටට නොලැබිණ.

## රජයට ලැබුණු ණය ප්‍රාග්ධනය

2004 වසර තුළදී රජයට ලැබුණු දිගුකාලීන ණය සියයට 16කින් අඩු වී එ.ජ.ඩොලර් දශලක්ෂ 771ක් වූ අතර, ණය ගෙවීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 28කින් අඩුවී එ.ජ.ඩොලර් දශලක්ෂ 331ක් විය. 2003 වසරේදී වැඩ සටහන් ණය ලෙස රජයට ලැබුණු එ.ජ.ඩොලර් දශලක්ෂ 226 සමග සැසඳීමේදී, 2004 වසරේ වැඩසටහන් ණය සැලකිය යුතු ලෙස අඩු වී එ.ජ.ඩොලර් දශලක්ෂ 30ක් වූ අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමයි. 2003 වසරේ එ.ජ. ඩො. දශලක්ෂ 569ක් වූ ව්‍යාපෘති ණය ආධාර 2004 වසරේ දී එ.ජ.ඩො. දශලක්ෂ 591 දක්වා සියයට 4කින් වැඩි විය. වසර අවසාන භාගයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් වීම, ව්‍යාපෘති ණය ලබා ගැනීම යථා තත්ත්වයට පත්වීමට උපකාරී විය.

මුළු ණය ලැබීම්වලින් සියයට 93ක් සහනදායී පදනම මත ලබාගත් අතර ඉතිරි සියයට 7 වාණිජ ණය විය. 2004 වසරේදී බහුපාර්ශවීය ණය දෙන ආයතන මගින් විශාල විදේශ ණය ප්‍රමාණයක් ලබා දී ඇත. පිළිවෙලින් එ.ජ.ඩොලර් දශලක්ෂ 185ක් සහ එ.ජ.ඩොලර් දශලක්ෂ 68ක් ලබා දුන් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය බහුපාර්ශවීය ණය ලබා දෙන්නන් අතර තවදුරටත් ප්‍රධානත්වය ඉසිලීය. ද්විපාර්ශවීය ණය ආධාර ලෙස ලැබුණු එ.ජ.ඩොලර් දශලක්ෂ 347න් එ.ජ.ඩොලර් දශලක්ෂ 271ක් ජපානයෙන් ද, එ.ජ.ඩොලර් දශලක්ෂ 25ක් ජර්මනියෙන් ද ලැබී ඇත. මුළු සහනදායී මූල්‍ය පහසුකම්වලින් සියයට 38ක් ජපානය විසින් ද, පිළිවෙළින් සියයට 26ක් සහ සියයට 10ක් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ද ලබා දී ඇත.

**5.9 සංඛ්‍යා සටහන**

**2004 වසර තුළ විදේශ ණය දෙන ආයතනවලින් විදේශ ආධාර ලබා දුන් ප්‍රධාන ව්‍යාපෘතීන්**

| දායකයා | ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ.ඩොලර් දශ ලක්ෂ |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | | **184.8** |
| එයින්: | තුන්වන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 26.2 |
| | වැවිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | 17.7 |
| | අයවැය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන | 15.6 |
| | උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | 15.0 |
| | ග්‍රාමීය මූල්‍ය අංශය සංවර්ධන වැඩසටහන | 14.9 |
| | ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතිය | 14.7 |
| | තුන්වන ජල සැපයුම් සහ සනීපාරක්ෂක අංශය | 11.7 |
| | දකුණු පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 11.5 |
| **ජාත්‍යන්තර සංවර්ධන ආයතනය** | | **67.8** |
| එයින්: | ගුරු අධ්‍යාපන සහ විස්ථාපන ව්‍යාපෘතිය | 14.0 |
| | පෞද්ගලික අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 11.9 |
| | පාරිසරික ක්‍රියාකාරිත්ව පළමු ව්‍යාපෘතිය | 10.5 |
| | දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය | 7.4 |
| **ජපානය** | | **270.9** |
| එයින්: | සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 60.4 |
| | කුඩා සහ සුළු පරිමාණ ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 30.8 |
| | කුකුලේගඟ ජල විදුලිබල යෝජනා ක්‍රමය | 24.1 |
| | සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 18.4 |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය | 16.7 |
| | මහකොළඹ සඳහා කළු ගඟ ජල යෝජනා ක්‍රම ව්‍යාපෘතිය | 15.3 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සහනදායී නියමයන් සහ කොන්දේසි මත ලැබුණු විදේශීය මූල්‍ය පහසුකම් අඩු වුවත්, වාණිජ නියමයන් සහ කොන්දේසි මත විදේශ විනිමය ණයකර ලබා ගැනීම සහ නැවත ආයෝජනය මගින් එය තරමක් දුරට සමනය කර ගැනීමට හැකි විය. මෙම ණය තාවකාලික වශයෙන් හිඟය පියවා ගැනීම සඳහා හේතු වුවත්, එය මැදි හා දිගු කාලීන අතිශයින්ම සහනාදායී නියමයන් සහ කොන්දේසි මත ලබාගන්නා විදේශ මූල්‍යයන් සඳහා ආදේශනය කළ නොහැක. විදේශීය අංශයෙන් බලන කල මෙම විදේශ විනිමය මගින් දක්වෙන ණයකර මගින් රට තුළට අමතර ප්‍රාග්ධනය ගලා ඒමක් සිදු නොවන අතර, එය දේශීය වාණිජ බැංකු මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් රජයට ණය ලබා දෙයි. වඩාත් සිදුවන්නේ වාණිජ බැංකු සතු විදේශීය වත්කම් නිල විදේශීය වත්කම් බවට මාරුවීමක් පමණි. රාජ්‍ය ණය අංශයෙන් බලන කල, ඉහළ වියදමක් සහ අඩු කල්පිරීමක් හේතුවෙන් මෙම ණය මගින් ණය සේවා පීඩනය වැඩිවේ. එබැවින් සහනදායී කොන්දේසි මත ලැබී ඇති විදේශීය ආධාර උපයෝජනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට උත්සාහ දැරීම විදේශ මූල්‍යනයේ ඉහළම උපාය මාර්ගය විය යුතුය.

2004 වසරේ විදේශීය ණය උපයෝජන අනුපාතය ප්‍රතිශතාංක 6කින් අඩු වී 2003 වසරේ පැවැති සියයට 24 සිට සියයට 18 දක්වා අඩු විය. මෙම පහළ උපයෝජන අනුපාතයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2004 වසරේ මුල් භාගයේ පැවැති දේශපාලන අස්ථාවරත්වයත්, ආයතනික දුර්වලතා, අනම්‍ය ක්‍රියාපිළිවෙත් සහ පරිපාලනමය දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමත්ය. අරමුදල් උපයෝජනය සඳහා රජය විසින් පත්කළ කමිටුව මෙම ගැටළුව විසඳීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ ද, සමස්ත උපයෝජන අනුපාතය මගින් පෙන්නුම් කරනුයේ ප්‍රශස්ථ මට්ටමට ළඟාවීමට නම් තවදුරටත් අඩුපාඩු සකස් කරගතයුතු බවය. රජයට ලැබෙන විදේශ ආධාරවල සහන බහුල වේ. ඒ නිසා එම ණය ආධාර ප්‍රයෝජනවත් ලෙස සහ කාලීනව උපයෝජනය කිරීම ඉතාම වැදගත් වන අතර, එම ණය ආධාරවල පිරිවැය අනෙකුත් වාණිජ මූලයන්ගෙන් ලබා ගන්නා ණය පිරිවැයට වඩා බෙහෙවින් අඩුය.

2003 වසරේදී විදේශ ආධාර උපයෝජන අනුපාතය සුළු වශයෙන් ඉහළයාමට හේතුවක් වූයේ, විදේශ අරමුදල් ව්‍යාපෘති වේගවත්ව ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් තාවකාලික ආයතනික වාතාවරණය නිසාය. නිසි අධිකාරියක් සහිත ස්ථිර ආයතනයක් ඇති කිරීමෙන් සහනදායී නියමයන් සහ කොන්දේසි මත ලැබී ඇති විදේශ ණය ආධාර උපයෝජන අනුපාතය වර්ධනය කිරීම තුළින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකිරීමට හැකි වේ. රජය විසින් දැනටමත් මෙම කටයුතු කරගෙන යාම සඳහා ජාතිය ගොඩනැගීමේ කාර්ය බලකාය නමින් ආයතනයක් පිහිටුවා සුනාමි ව්‍යසනයෙන් පසු ප්‍රතිසංවිධාන කටයුතු සඳහා පොරොන්දු වූ විදේශ ආධාර භාවිතය වේගවත් කිරීමට පියවර ගෙන ඇත.

**පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධනය**

පෞද්ගලික අංශයේ දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් 2003 වසරේ පැවැති එ.ජ.ඩොලර් දශලක්ෂ 101 සිට 2004 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 169 දක්වා තියුණු ලෙස වැඩිවිය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ, විදේශීය ආයෝජකයින් අතර කිහිප ගුණයකින් අධි ඉල්ලුමක් වූ එ.ජ.ඩොලර් දශලක්ෂ 100ක ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ බැඳුම්කර නිකුතුවයි. මෙය ශ්‍රී ලංකා සමාගමක් විසින් ජාත්‍යන්තර වෙළෙඳපළ වෙත ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කළ ප්‍රථම අවස්ථාව වන අතර, එය ශ්‍රී ලංකාවේ අනිකුත් සමාගම් ද ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත පිවිසීමට උනන්දු කරවීමකි. රජයේ ඇපවීමකින් තොරව මෙම බැඳුම්කර සඳහා පහළ අනුපාතයක් යටතේ අරමුදල් ලබාගැනීමට සමාගමට හැකි විය. මේ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ස්වාධීනව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරිමක් ලබාගතයුතු වූ අතර එය රටේ ස්වාධීන ශ්‍රේණිගත කිරීමට සම්බන්ධ නොවිණි. එම නිසා, ඉතා ගුණාත්මක නියමයන් සහ කොන්දේසි මත පෞද්ගලික අංශයට ජාත්‍යන්තර වෙළෙඳපළ මගින් මැදි හා දිගුකාලීන ණය ලබා ගැනීමට ස්වාධීන ශ්‍රේණිගත කිරීම ඉවහල් වනු ඇත. දේශීය වෙළෙඳපොළේ සිත්ගන්නා ණය පොලී අනුපාතයක් පැවති බැවින්, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හැරුණු විට ඉතා සුළු සමාගම් කිහිපයක් පමණක් 2004 වසරේදී විදේශීය ණය ලබා ගෙන ඇත.

අතීතයේදී, පෞද්ගලික අංශයේ විදේශීය ණය ලබා ගැනීම සිදුවූයේ රජය අරමුදල් ලබා ගෙන පෞද්ගලික අංශය වෙත ලබාදීම හෝ රජය ඇපවීම මගිනි. මෙයට එක් හේතුවක් වූයේ රාජ්‍ය සංස්ථා බොහොමයක් රජයේ අයිතිය යටතේ පැවැතීමයි. මෙම සංස්ථා පෞද්ගලීකරණය මගින් සහ රජයේ ණය ඉහළ යාම නිසා රජය විසින් පෞද්ගලික අංශයේ මැදි හා දිගුකාලීන ණය ලබාගැනීමට මැදිහත් වීමෙන් ක්‍රමයෙන් ඉවත් විය. කෙසේ වෙතත්, ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා දේශීය මූලාශ්‍රවලින් ලබාගන්නා ණය ආධාර ප්‍රමාණවත් නොවන බැවින්, පෞද්ගලික අංශයේ මැදි හා දිගුකාලීන ආයෝජන සඳහා තරගකාරී අනුපාත යටතේ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ණය ආධාර ලබා ගැනීම අවශ්‍යය. ශ්‍රී ලංකාව සඳහා ස්වාධීන ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම මගින් පෞද්ගලික අංශයට අවශ්‍ය විදේශීය ණය ලබා ගැනීමේ පහසුකම් සැපයීම සඳහා රජයට විශාල කාර්යභාරයක් සිදුකළ හැකිය. ශ්‍රී ලංකාව සඳහා ස්වාධීන ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සලය යටතේ මෑතකදී ගත් තීරණය, එම අංශයෙන් නිවැරදි මාර්ගය වෙත යොමුවීමකි.

**කෙටිකාලීන ප්‍රාග්ධනය**

2003 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 2ක් වූ ශුද්ධ විවිධ ආයෝජන ගලාඒම් සමඟ සසඳන විට 2004 වසරේ ශුද්ධ ආයෝජන ගලාඒම් එ.ජ.ඩොලර් දශලක්ෂ 11ක් විය. විදේශීය ආයෝජකයන්ගේ විශ්වසනීයත්වය තහවුරු කරමින්,

කලාපයේ අනෙකුත් කොටස් වෙළෙඳපළ හා සසඳන විට ශ්‍රී ලංකාවේ කොටස් හුවමාරුව වසර පුරාම ඉහළ ක්‍රියාකාරී මට්ටමක පැවැතිණි. ප්‍රධාන පෙළේ සමාගම්වල ආයෝජනය කිරීමට වැඩි කැමැත්තක් දැක්වීම සහ ශ්‍රී ලංකාවේ ඉහළ වර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා හේතුවෙන් 2004 වසරේදී ශ්‍රී ලංකාවේ හිමිකම් ප්‍රාග්ධනය තුළ ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයන් වැඩි නැඹුරුවක් දැක්වූහ. මේ අතර, 2003 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 19ක් වූ අපනයන ආනයන සම්බන්ධ ණය ඇතුළත් පෞද්ගලික අංශයේ කෙටිකාලීන ණය, 2004 වසරේ බාහිර වෙළෙඳම පුළුල්වීම නිසා එ.ජ.ඩොලර් දශලක්ෂ 28ක ඉහළ අගයක් වාර්තා කළේය.

වාණිජ බැංකු සතු විදේශීය වත්කම්වලින් කොටසක් විදේශීය ව්‍යවහාර මුදලින් සමන්විත දේශීය වත්කම් බවට හරහා තිබියදීත් පෙර වසරේ වාර්තා කළ එ.ජ.ඩොලර් දශලක්ෂ 95 සමඟ සසඳන විට 2004 වසරේ වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම් එ.ජ.ඩොලර් දශලක්ෂ 152 දක්වා ඉහළ ගියේය. අනේවාසික විදේශීය විනිමය ගිණුම්වලට පෞද්ගලික සංක්‍රාම ලැබීම ඉහළ යාම, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ වත්කම් ලංකා ඉන්දීය තෙල් සමාගම වෙත පෞද්ගලිකකරණය කිරීම මගින් ලබා ගත් හිඟ මුදල් ලැබීම, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව, වාණිජ බැංකු සහ පෞද්ගලික අංශයේ සමාගම් කිහිපයක් විදේශීය ණය ලබාගැනීම ආදිය වාණිජ බැංකු සතු විදේශීය වත්කම් ඉහළ යාමට ප්‍රධාන හේතූන් විය. ප්‍රධාන වශයෙන් විදේශීය මුදල් තැන්පතු සැලකිය යුතු ලෙස ඉහළ යාම නිසා වාණිජ බැංකු සතු විදේශීය වගකීම් ඉහළ ගියේය. දෙවන හා තුන්වන කාර්තුවල රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වීමත්, හතරවන කාර්තුවේදී එය තවදුරටත් අවප්‍රමාණය වේ යැයි අපේක්ෂා කිරීමත් නිසා වාණිජ බැංකු විසින් විදේශීය මුදල් එකතු කර ගැනීමටත් රඳවා තබා ගැනීමටත් පෙර වසරට වඩා උනන්දුවක් දැක්වීය.

**ගෙවුම් තුලනය සහ විදේශ වත්කම්**

2003 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 502ක් වූ අතිරික්තය සමඟ සසඳන විට ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්වල අතිරික්තය ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් නොවූ හෙයින් 2004 වසරේ සමස්ත ගෙවුම් ශේෂය එ.ජ.ඩොලර් දශලක්ෂ 205ක හිඟයක් වාර්තා කළේය. මෙම හිඟය 2004 වසරේදී විනිමය අනුපාතය සහ නිල වත්කම් කෙරෙහි වැඩි පීඩනයක් ඇති කිරීමට හේතු විය.

**විදේශීය වත්කම්**

2001 වසරේ සිට අඛණ්ඩව වසර තුනක් සමස්ත ගෙවුම් ශේෂයේ අතිරික්තයන් මගින් පිළිබිඹු වූ රටෙහි දළ නිල වත්කම් 2004 වසරේදී පහත වැටිණි. තෙල් මිල ඓතිහාසික ලෙස ඉහළ යාම ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යාමත්, ආයෝජන සහ අන්තර් භාණ්ඩ ආනයන පරිමාව ඉහළ යාම නිසා වසර තුළ ආනයන වියදම් විශාල වශයෙන් ඉහළයාමත් හේතුවෙන් විදේශ වත්කම් සහ විනිමය අනුපාතය කෙරෙහි දැඩි පීඩනයක් ඇති විය. මීට අමතරව ණය දෙන ආයතන මගින් රජයට ලබාදෙන ආධාර ප්‍රමාදවීම නිසා දෙවන හා තුන්වන කාර්තුවල විනිමය අනුපාතයේ ඇති වූ උච්චාවචනයන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වූ අතර එහෙයින් අවසානයේදී විදේශ වත්කම් අඩු විය. කෙසේ වෙතත්, හතරවන කාර්තුවේදී ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ජපානයෙන් මූල්‍ය පහසුකම් ලැබීමත්, විදේශ විනිමය ණය අළුතෙන් නිකුත් කිරීම සහ නැවත ආයෝජනය කිරීමත්, ශ්‍රී

**5.10 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් (අ)**

| ශීර්ෂය | එ. ජ. ඩො. දශ ලක්ෂ (ආ) | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2000 | 2001 | 2002 | 2003 | 2004 |
| 1. රජය | 22 | 78 | 46 | 55 | 95 | 1,767 | 7,302 | 4,424 | 5,320 | 9,897 |
| 2. රාජ්‍ය නියෝජ්‍යකත්වය | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව | 1,026 | 1,260 | 1,654 | 2,274 | 2,101 | 81,819 | 117,365 | 160,018 | 219,984 | 219,795 |
| 4. මුළු නිල වත්කම් | 1,049 | 1,338 | 1,700 | 2,329 | 2,196 | 83,585 | 124,668 | 164,442 | 225,304 | 229,693 |
| 5. වාණිජ බැංකු | 1,083 | 900 | 795 | 889 | 1,243 | 86,682 | 83,815 | 76,921 | 86,011 | 129,987 |
| 6. මුළු විදේශීය වත්කම් | 2,131 | 2,238 | 2,495 | 3,218 | 3,438 | 170,268 | 208,482 | 241,364 | 311,315 | 35,9680 |
| 7. දළ නිල වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 1.7 | 2.7 | 3.3 | 4.2 | 3.3 | | | | | |
| 7.2 භාණ්ඩ හා සේවා | 1.5 | 2.3 | 2.9 | 3.6 | 2.9 | | | | | |
| 8. මුළු වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 3.5 | 4.5 | 4.9 | 5.8 | 5.2 | | | | | |
| 8.2 භාණ්ඩ හා සේවා | 3.1 | 3.8 | 4.2 | 5.0 | 4.5 | | | | | |

(අ) 2002 වසරේ සිට සංචිත ගණනය කර ඇත්තේ වෙළෙඳපොළ වටිනාකම අනුවය.

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| වසර | 2000 | 2001 | 2002 | 2003 | 2004 |
|---|---|---|---|---|---|
| එ.ජ.ඩොලර් එකකට රුපියල් | 80.06 | 93.16 | 96.73 | 96.74 | 104.61 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.8 රූප සටහන**
**විදේශ සංචිත (ත්‍රෛමාසිකව)**




ලංකා ටෙලිකොම් ආයතනයේ විදේශීය ණය රජයට ගෙවීමත් නිසා අඩුවෙමින් පැවැති නිල වත්කම් යම් ප්‍රමාණයකින් වැඩි කර ගැනීමට හැකි විය. මෙම වර්ධනයන් පෙන්නුම් කරමින් දළ නිල වත්කම් 2003 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් දශලක්ෂ 2,329 සිට 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 2,196 දක්වා අඩු විය.

විදේශ අංශයේ මූලික දර්ශකවලට අනුව නිල වත්කම්වල අඩුවීම රටේ බාහිර කම්පනයන්ට මුහුණ දීමේ හැකියාව අඩු වූ බව පෙන්නුම් කරයි. 2003 වසරේදී මාස 4.2ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ දළ නිල වත්කම් ප්‍රමාණය 2004 වසරේදී මාස 3.3ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් මට්ටමට අඩු විය. එසේම 2004 වසර අවසානය වන විට පැවති නිල සංචිත මට්ටම ප්‍රමාණවත් වූයේ මුළු කෙටිකාලීන විදේශ ණය වලින් සියයට 79ක් ආවරණය කිරීමට පමණක් වූ අතර, එය 2003 වසරේදී සියයට 102ක් විය. වසරක් ඇතුළත කල්පිරෙන විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත දේශීය වගකීම්, කෙටි කාලීන විදේශ වගකීම් ලෙස ඇතුළත් කළහොත් මෙම අනුපාතය 2004 වසර අවසානය වන විට සියයට 74 දක්වා තවදුරටත් අඩුවනු ඇත. රජයේ විදේශ ණය ආපසු ගෙවනු ලබන්නේ දළ නිල සංචිත යොදා ගැනීමෙන් බැවින් පසුව දක්වන ලද අනුපාතය විදේශීය අංශයේ සංවේදිතා අංශයෙන් බලන විට වඩා යෝග්‍ය මිණුම් දර්ශකයක් වේ.

දළ නිල සංචිත අඩුවූවත්, වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඉහළ දැමීම නිසා රටේ මුළු වත්කම් 2003 වසරේ පැවති එ.ජ.ඩොලර් දශලක්ෂ 3,218 සිට 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 3,438 දක්වා එ.ජ.ඩොලර් දශලක්ෂ 220 කින් වැඩි විය.

## 5.6 විදේශ ණය සහ ණය සේවා

### විදේශ ණය

2003 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 58.4ක් වූ ශ්‍රී ලංකාවේ මුළු විදේශ ණය 2004 වසරේදී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 57.8 දක්වා පහත වැටිණි. කෙසේ වෙතත්, නිරපේක්ෂ අගය අනුව 2004 වසර අවසාන වන විට විදේශ මුළු ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශලක්ෂ 11,346 දක්වා සියයට 7කින් ඉහළ ගියේය. වඩා පුළුල් සමස්තයක් ලෙස මුළු විදේශ ණය සහ බැංකු අංශයේ විදේශ වගකීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 12,775 දක්වා සියයට 9කින් ඉහළ ගියේය. මෙම වර්ධනය රජයේ සහනදායී ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් යන දෙඅංශයේම ඉහළ යාම මගින් පිළිබිඹු විය. එ.ජ. ඩොලර්වලින් දක්වෙන විදේශ ණයෙහි ඉහළයාමෙන් සියයට 40කටට වැඩි ප්‍රමාණයක් ඉහළ ගොස් ඇත්තේ අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව ඩොලරය අවප්‍රමාණය වීම හේතුවෙනි. මුළු විදේශ ණය ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 42ක් සහ සියයට 31ක් පිළිවෙලින් වි.ගැ.හි සහ ජපන් යෙන්වලින් සමන්විත වේ.

මැදි හා දිගුකාලීන ණය, මුළු ණය තොගයෙන් සියයට 94ක් පමණ වන අතර එය ප්‍රධාන වශයෙන් සියයට 84ක් පමණ වන රජයේ සහනදායී ණයවලින් සහ සියයට 16ක් වන සහනදායී නොවන ණයවලින් සමන්විත වේ. සහනදායී නොවන ණයවලින් විශාල ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ මැදි හා දිගුකාලීන ණය නිරූපණය කරන අතර රජයේ සහනදායී නොවන ණය තොගය සාපේක්ෂව කුඩා ප්‍රමාණයකි. 2004 වසර අවසාන වන විට රජයේ සහනදායී නොවන ණය තොගය එ.ජ.ඩොලර් දශලක්ෂ 232 දක්වා සියයට 7කින් වර්ධනය විය. සහනදායී ණය වැඩි ප්‍රමාණයක් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහ සහනදායී නොවන ණය සීමා කිරීම, ශ්‍රී ලංකාවේ විදේශ ණය මට්ටම දරා ගතහැකි මට්ටමක පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධක වේ.

2004 වසර තුළදී පෞද්ගලික අංශයේ මුළු කෙටිකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශලක්ෂ 620 සිට එ.ජ.ඩොලර් දශලක්ෂ 647 දක්වා සියයට 4කින් පමණ වර්ධනය විය. අවිනිශ්චිත වගකීම් අඩු කිරීමේ ප්‍රතිපත්තිය අනුව යමින් රජය ණය සඳහා ඇපවීම සම්බන්ධයෙන් ප්‍රවේශම්කාරී වීම හේතුවෙන් රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ රජය ඇපවූ විදේශ ණය තොගය එ.ජ.ඩොලර් දශලක්ෂ 507 දක්වා සියයට 16කින් පහත වැටිණි. 2004 වසර තුළදී මෙම පහත වැටීමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතනවල එ.ජ.ඩොලර් දශලක්ෂ 73ක් වූ ණය ආපසු ගෙවීමයි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් එ.ජ.ඩොලර් දශලක්ෂ 100ක සාර්ථක ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව හේතුවෙන් 2004 වසරේ පෞද්ගලික අංශයේ රජයේ ඇප නොවූ විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශලක්ෂ 411 දක්වා සියයට 23කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

වෙළෙඳ ණයවලින් සමන්විත වන රටේ කෙටිකාලීන විදේශ ණය තොගය, එ.ජ.ඩොලර් දශලක්ෂ 647 දක්වා සියයට 4කින් ඉහළ ගියේය. මුළු ණය තොගයෙන් කෙටිකාලීන ණය

**5.11 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්**

| ශීර්ෂය | එ. ජ. ඩො. දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2000 | 2001 | 2002 | 2003 | 2004(අ) | 2000 | 2001 | 2002 | 2003 | 2004(අ) |
| **1. මැදි හා දිගු කාලීන ණය** | **8,456** | **7,839** | **8,732** | **10,027** | **10,698** | **676,045** | **730,245** | **844,709** | **970,004** | **1,119,090** |
| 1.1 රජය | 6,989' | 6,808 | 7,464 | 8,723 | 9,523 | 559,544 | 634,255 | 721,956 | 843,882 | 996,138 |
| 1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 1,028 | 572 | 689 | 602 | 507 | 82,302 | 53,324 | 66,663 | 58,251 | 52,986 |
| 1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 278 | 249 | 293 | 334 | 411 | 22,257 | 23,203 | 28,303 | 32,319 | 42,944 |
| 1.4 ජා.මූ.අ.න් කළ ගැණුම් | 161 | 209 | 287 | 368 | 258 | 11,943 | 19,463 | 27,787 | 35,552 | 27,023 |
| **2. කෙටි කාලීන ණය** | **575** | **533** | **601** | **620** | **647** | **46,034** | **49,648** | **58,116** | **59,935** | **67,726** |
| 2.1 රජය | - | - | - | - | - | - | - | - | - | - |
| 2.2 අනෙකුත් (ආ) | 575 | 533 | 601 | 620 | 647 | 46,034 | 49,648 | 58,116 | 59,935 | 67,726 |
| **3. බැංකු අංශය විදේශ වගකීම් (ඇ)** | **1,076** | **1,119** | **1,001** | **1,046** | **1,429** | **86,132** | **104,201** | **96,807** | **101,149** | **149,492** |
| 3.1 මහ බැංකුව | ... | 2 | 1 | - | 1 | 33 | 172 | 123 | 32 | 128 |
| 3.2 වාණිජ බැංකු | 938 | 1,009 | 865 | 863 | 1,066 | 75,101 | 94,030 | 83,655 | 83,514 | 111,464 |
| 3.3 ආ. නි. සංගමයේ වගකීම් | 137 | 107 | 135 | 182 | 362 | 10,998 | 9,999 | 13,029 | 17,604 | 37,899 |
| **4. මුළු විදේශීය ණය (1+2)** | **9,031** | **8,372** | **9,333** | **10,647** | **11,346** | **722,079** | **779,893** | **902,825** | **1,029,939** | **1,186,816** |
| **5. මුළු විදේශීය ණය සහ වගකීම් (1+2+3)** | **10,106** | **9,490** | **10,334** | **11,692** | **12,775** | **808,211** | **884,095** | **999,632** | **1,131,088** | **1,336,308** |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | | |
| **මැදි හා දිගු කාලීන ණය** | | | | | | | | | | |
| (1) ව්‍යාපෘති ණය | 5,346 | 5,374 | 4,358 | 6,961 | 7,702 | 427,965 | 480,237 | 421,637 | 673,432 | 805,646 |
| (2) ව්‍යාපෘති නොවන ණය | 1,426 | 1,154 | 3,048 | 1,726 | 1,763 | 114,174 | 103,163 | 294,880 | 167,007 | 184,467 |
| (3) සැපයුම්කරුවන්ගේ ණය | 338 | 316 | 100 | 216 | 232 | 27,074 | 29,411 | 9,718 | 20,921 | 24,259 |
| (4) ජා.මූ.අ.න් කළ ගැණුම් | 161 | 209 | 287 | 368 | 258 | 11,943 | 19,463 | 27,787 | 35,552 | 27,023 |
| (5) අනෙකුත් ණය (ඈ) | 1,185 | 786 | 939 | 756 | 743 | 94,890 | 97,971 | 90,686 | 73,092 | 77,696 |
| **කෙටිකාලීන ණය හා බැංකු අංශයේ වගකීම්** | **1,650** | **1,651** | **1,602** | **1,665** | **2,077** | **132,166** | **153,850** | **154,923** | **161,084** | **217,217** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | | | | |
| මුළු විදේශ ණය | 54.5 | 53.2 | 56.3 | 58.4 | 57.8 | 57.5 | 55.4 | 57.0 | 58.5 | 59.7 |
| බැංකු අංශයේ මුළු විදේශීය වගකීම් | 6.5 | 7.1 | 6.0 | 5.7 | 7.3 | 6.9 | 7.4 | 6.1 | 5.7 | 7.5 |
| මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් | 61.0 | 60.3 | 62.4 | 64.1 | 65.0 | 64.4 | 62.8 | 63.1 | 64.3 | 67.2 |
| කෙටිකාලීන ණය | 3.5 | 3.4 | 3.6 | 3.4 | 3.3 | 3.7 | 3.5 | 3.7 | 3.4 | 3.4 |
| කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශ වගකීම් | 10.0 | 10.5 | 9.7 | 9.1 | 10.6 | 10.5 | 10.9 | 9.8 | 9.2 | 10.9 |
| **මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | | | | |
| කෙටිකාලීන ණය | 5.7 | 5.6 | 5.8 | 5.3 | 5.1 | 5.7 | 5.6 | 5.8 | 5.3 | 5.1 |
| කෙටිකාලීන වගකීම් | 10.6 | 11.8 | 9.7 | 8.9 | 11.2 | 10.7 | 11.8 | 9.7 | 8.9 | 11.2 |
| කෙටිකාලීන ණය, නිල විදේශීය සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් | 54.8 | 39.8 | 35.3 | 26.6 | 29.5 | 55.1 | 39.8 | 35.3 | 26.6 | 29.5 |

(අ) තාවකාලික
(ආ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙළෙඳ ණය ඇතුළත් කොට ඇත.
(ඇ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය සහ වි.ව්‍ය.මු.බැ.ඒ. ඇතුළත් වාණිජ බැංකුවල විදේශ වගකීම් ද ඇතුළත් වේ.
(ඈ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ප්‍රමාණය සියයට 5.7 දක්වා සුළු වශයෙන් පහත වැටිණි. 2004 වසරේදී සමීපස්ථ ණය පහසුකම (SBA) යටතේ ගෙවීමට තිබූ ණය ආපසු ගෙවීම හේතුවෙන් ජා.මූ. අරමුදල වෙත ඇති වගකීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 110කින් අඩු විය. මේ අතර, ආසියානු නිෂ්කාෂණ සංගමයේ (ACU) වගකීම් ප්‍රමාණය තාවකාලිකව ඉහළ යාම සහ වාණිජ බැංකුවල වගකීම් ඉහළ යාම හේතුවෙන් 2004 වසර අවසාන වන විට බැංකු අංශයේ විදේශ වගකීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 1,429 දක්වා එ.ජ.ඩොලර් දශලක්ෂ 383කින් ඉහළ ගියේය.

ඉහත සඳහන් කරන ලද වර්ධනයන් නිරූපනය කරමින් මුළු විදේශ ණය සහ බැංකු ක්‍රමයේ වගකීම් ඇතුළු අනෙකුත් වගකීම් 2004 වසරේදී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 65 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. එය 2003 වසරේදී ද.දේ.නි.යෙන් සියයට 64.1 ක් විය. කෙසේ වෙතත් ඉහත පැහැදිලි කළ අන්දමට, ණය තොගය එ.ජ.ඩොලර් දශලක්ෂ 12,775ක් දක්වා සියයට 9කින් වර්ධනය විය.

### විදේශ ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය මත ණය වාරික ගෙවීම් සහ සියළුම විදේශ ණය සඳහා පොලී ගෙවීම මගින් සමන්විත වන මුළු ණය සේවා ගෙවීම් 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 839 දක්වා සියයට 10කින් ඉහළ ගියේය. ණය සේවා ගෙවීම්වලින් සියයට 70ක් පමණ වන මුළු ණය වාරික ආපසු ගෙවීම් 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 590 දක්වා සියයට 12කින් වර්ධනය වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ සමීපස්ථ ණය පහසුකම් යටතේ ජා.මූ. අරමුදලට ගෙවීමට තිබූ ණය ආපසු ගෙවීම ඉහළ යාමය. ජා.මූ.අරමුදල වෙත ණය ආපසු ගෙවීම 2003 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 32 සිට 2004 වසර තුළදී එ.ජ.ඩොලර් දශලක්ෂ 107 දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ආරක්ෂක ණය ආපසු ගෙවීම් අඩුවීම හේතුවෙන් ණය ගෙවීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 331 දක්වා සියයට 8කින් පහත වැටිණි.

**5.12 සංඛ්‍යා සටහන**
**ණය සේවා ගෙවීම්**

| ශීර්ෂය | එ. ජ. ඩො. දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2000 | 2001 | 2002 | 2003 | 2004(අ) | 2000 | 2001 | 2002 | 2003 | 2004(අ) |
| **1. ණය සේවා ගෙවීම්** | **953** | **813** | **788** | **761** | **839** | **74,554** | **72,584** | **74,704** | **73,125** | **84,845** |
| 1.1 ණය ආපසු ගෙවීම් | 621 | 558 | 572 | 526 | 590 | 49,410 | 49,883 | 54,006 | 50,502 | 59,561 |
| (i) ජා. මු. අරමුදලට | 97 | 78 | 56 | 32 | 107 | 9,700 | 6,966 | 4,647 | 2,869 | 10,718 |
| (ii) අනෙකුත් | 524 | 480 | 516 | 493 | 483 | 39,711 | 42,918 | 49,359 | 47,632 | 48,843 |
| 1.2 පොලී ගෙවීම් | 332 | 254 | 216 | 235 | 249 | 25,144 | 22,701 | 20,698 | 22,623 | 25,284 |
| (i) ජා. මු. අරමුදලට | 5 | 4 | 4 | 4 | 10 | 410 | 348 | 398 | 414 | 988 |
| (ii) අනෙකුත් | 326 | 251 | 212 | 230 | 240 | 24,734 | 22,353 | 20,300 | 22,209 | 24,297 |
| **2. වෙළෙඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපැයීම** | **6,476** | **6,172** | **5,967** | **6,544** | **7,284** | **492,301** | **551,309** | **571,195** | **631,549** | **738,714** |
| **3. වෙළෙඳ භාණ්ඩ අපනයන සේවා, ආදායම් හා පෞද්ගලික සංක්‍රාම** | **7,787** | **7,436** | **7,330** | **8,127** | **9,004** | **591,567** | **664,073** | **701,579** | **784,408** | **912,818** |
| **4. ණය සේවා අනුපාතිකය (ආ)** | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 14.7 | 13.2 | 13.2 | 11.6 | 11.5 | 15.1 | 13.2 | 13.1 | 11.6 | 11.5 |
| (ii) ජා. මු. අරමුදලේ ගනුදෙනු හැර | 13.1 | 11.8 | 12.2 | 11.1 | 9.9 | 13.1 | 11.8 | 12.2 | 11.1 | 9.9 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 12.2 | 10.9 | 10.8 | 9.4 | 9.3 | 12.6 | 10.9 | 10.6 | 9.3 | 9.3 |
| (ii) ජා. මු. අරමුදලේ ගනුදෙනු හැර | 10.9 | 9.8 | 9.9 | 8.9 | 8.0 | 10.9 | 9.8 | 9.9 | 8.9 | 8.0 |
| **5. රජයේ ණය සේවා ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඇ) | 437 | 450 | 522 | 502 | 484 | 33,100 | 40,190 | 49,928 | 48,452 | 48,952 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 45.9 | 55.3 | 66.2 | 66.0 | 57.7 | 44.4 | 55.4 | 66.8 | 66.3 | 57.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) වසර තුළ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ. ජ. ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඇ) ජාමුඅරමුදලෙහි ගණුදෙනු හැර

රජයේ විදේශ ණය තොගය වැඩිවීම සහ ඉහළ ජාත්‍යන්තර පොලී අනුපාත යන කරුණු දෙක නිරූපණය කරමින්, 2004 වසරේදී පොලී ගෙවීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 249 දක්වා සියයට 6කින් පමණ ඉහළ ගියේය. තව දුරටත්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ එ.ජ.ඩොලරය දුර්වල වීම හේතුවෙන් ජපන් යෙන්වලින් සහ වි.ගැ.හි.වලින් සමන්විත ණය ආපසු ගෙවීම් පිළිවෙළින් සියයට 19කින් සහ සියයට 16කින් වැඩි විය.

විදේශ විනිමය ඉපැයීම්හි යම් වර්ධනයක් තිබියදීත්, ණය සේවා අනුපාතය මගින් මනිනු ලබන රටේ විදේශ ණය ආපසු ගෙවීමේ හැකියාව 2003 වසරේ වර්ධනය හා සැසඳීමේදී 2004 වසරේදී සුළු වශයෙන් පහත වැටුණු අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර තුළදී ජා.මු. අරමුදලට කරන ලද ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ යාමය. ජා.මු. අරමුදලට කරන ලද ගෙවීම් ඉවත් කළ පසු, එම අනුපාතය 2003 වසරේ පැවති මට්ටමෙහිම පැවතිණි. කෙසේ වෙතත්, මුළු රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සහනදායී ණය ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බැවින් මෙම අනුපාතයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රටට අධික පීඩනයක් ලෙස නොසැලකේ.

**5.9 රූප සටහන**
**විදේශ ණය**




## 5.7 විනිමය අනුපාත ක්‍රම සහ විනිමය අනුපාතයෙහි වෙනස්වීම්

2003 නොවැම්බර් මාසයේදී ඩොලරයට එරෙහි රුපියලේ විනිමය අනුපාතය ඊට පෙර අත්දකින ලද අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාව ආපසු හැරීමට පටන් ගැනිණි. ජාත්‍යන්තර සහ දේශීය බලපෑම් හේතුවෙන් 2003 වසරේ අවසන් මාස දෙක තුළදී විනිමය අනුපාතය අධික උච්චාවචනයන්ට ලක්විය. 2004 වසරේ ප්‍රධානම ලක්ෂණය වූයේ මෙම අවප්‍රමාණය වීමේ ප්‍රවණතාව වසර තුළ තවදුරටත් ක්‍රියාත්මක වීමයි. 2004 වසරේ ගෙවුම් තුලනයෙහි හිඟය, විනිමය අනුපාතය කෙරෙහි පීඩනයක් ඇති කිරීමට හේතු වූ අතර, 2004 වසරේ දෙසැම්බර් 17 වන දින එ.ජ.ඩොලරයක අගය රුපියල් 105.47ට ළඟා වෙමින් ඉහළම අන්තර් බැංකු විනිමය අනුපාතය වාර්තා කළේය. කෙසේ වෙතත්, සුනාමි ව්‍යසනයෙහි පසු බලපෑමක් වශයෙන් රට තුළට විශාල විදේශ ආධාර ප්‍රමාණයක් ගලා එනු ඇතැයි යන අපේක්ෂාව සමඟ වෙළෙඳපොළ ප්‍රතික්‍රියා කළ අතර, 2004 වසරේ දෙසැම්බර් 31 දින වන විට විනිමය

**5.13 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වසරට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2002 | 2003 | 2004 | 2002 | 2003 | 2004 | 2003 | 2004 | 2003 | 2004 |
| යුරෝ | 101.38 | 121.60 | 142.32 | 90.43 | 109.16 | 125.79 | -16.6 | -14.6 | -17.2 | -13.2 |
| ඉන්දියානු රුපියල් | 2.01 | 2.12 | 2.40 | 1.97 | 2.07 | 2.23 | -5.1 | -11.5 | -4.9 | -7.2 |
| ජපන් යෙන් | 0.82 | 0.90 | 1.02 | 0.77 | 0.83 | 0.94 | -9.7 | -11.2 | -7.6 | -10.9 |
| බ්‍රිතාන්‍ය පවුම් | 155.13 | 172.20 | 201.37 | 143.74 | 157.71 | 185.35 | -9.9 | -14.5 | -8.9 | -14.9 |
| එ. ජ. ඩොලර් | 96.73 | 96.74 | 104.61 | 95.66 | 96.52 | 101.19 | 0.0 | -7.5 | -0.9 | -4.6 |
| විශේෂ ගැනුම් හිමිකම් | 130.99 | 143.75 | 161.60 | 123.93 | 135.23 | 149.88 | -8.9 | -11.0 | -8.4 | -9.8 |

| සඵල විනිමය අනුපාත දර්ශක (ආ) | මාසික දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2002 දෙසැ. | 2003 දෙසැ. | 2004 දෙසැ. | 2002 | 2003 | 2004 | 2003 | 2004 | 2003 | 2004 |
| නා.ස.වි.අ. (1999 = 100) | 76.07 | 71.58 | 63.18 | 78.87 | 73.84 | 67.63 | -5.90 | -11.74 | -6.38 | -8.41 |
| මූ.ස.වි.අ. (1999 = 100) | 100.08 | 96.75 | 94.84 | 99.33 | 97.25 | 93.61 | -3.33 | -1.97 | -2.09 | -3.74 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළෙඳමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතය (මූ.ස.වි.අ) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි සෘණ ලකුණින් පෙන්නුම් කරනුයේ අගය අඩුවීමකි.

අනුපාතය එ.ජ.ඩොලරයට රුපියල් 104.61 දක්වා අතිප්‍රමාණය විය. වසර සමස්තයක් වශයෙන් ගත් විට රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 7.5කින් අවප්‍රමාණය වූ අතර, 2003 වසරේදී එය සියයට 0.01ක ඉතා සුළු අවප්‍රමාණයක් පමණක් විය.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි එ.ජ.ඩොලරයට එරෙහි හරස් විනිමය අනුපාතයන්හි වෙනස්වීම් පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව සාපේක්ෂව ඉහළ අනුපාතයකින් අවප්‍රමාණය විය. එය යුරෝ (සියයට 14.6), ස්ටර්ලිං පවුම (සියයට 14.5), ඉන්දියානු රුපියල (සියයට 11.5), ජපාන යෙන් (සියයට 11.2) සහ වි.ගැ.හි. (සියයට 11) වලට එරෙහිව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය.

## නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාත

අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව රුපියල සාපේක්ෂ වශයෙන් ඉහළ අගයකින් අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2004 වසර තුළදී මුදල් වර්ග පහකින් (එ.ජ.ඩොලර්, ජපන් යෙන්, ස්ටර්ලිං පවුම, ඉන්දියානු රුපියල සහ යුරෝ ඇතුළත්) සැදුම්ලත් පැස මත පදනම්වන නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ.) සියයට 10.3කින් අවප්‍රමාණය වූ අතර, වෙළෙඳ හවුල්කාර රටවල් සහ තරඟකාරී රටවල් 24කින් සැදුම්ලත් පැස මත පදනම් වන නා.ස.වි.අ. සියයට 11ක ඉහළ අගයකින් අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, උද්ධමන අනුපාතිකයන්ගේ වෙනස්වීම ගැලපූ විට, මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) මුදල් වර්ග පහකින් සැදුම්ලත් පැසට අනුව සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැසට අනුව පිළිවෙළින් සියයට 1.0 කින් සහ සියයට 1.1කින් සුළු වශයෙන් අවප්‍රමාණය වූයේ ශ්‍රී ලංකාවේ විදේශ තරගකාරිත්වය සුළු වශයෙන් පමණක් ඉහළ ගිය බව පෙන්නුම් කරමිනි. ඒ අනුව, සමස්තයක් ලෙස 2004 වසරේදී ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකය මූර්ත වශයෙන් ස්ථාවරව පැවතුණි.

## දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

වසර තුළ විදේශීය අංශයේ සිදු වූ වර්ධනයන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි 2004 වසරේ ක්‍රියාකාරිත්වය කෙරෙහි මිශ්‍ර බලපෑම් ඇති කළේය. මෙම අවිනිශ්චිතතා තුළ ඉදිරි විනිමය කටයුතු අධෛර්යමත් කිරීමේ බලපෑමක් පැවති නමුත් අන්තර් බැංකු එතැන් විනිමය වෙළෙඳපොළ ගනුදෙනු ඉහළ යාමට හේතු විය.ඉදිරි විනිමය ගනුදෙනු ප්‍රමාණයද ඇතුළත් අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව 2003 වසරේ එ.ජ.ඩොලර් දශලක්ෂ 3,649 සිට 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 4,330 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, මෙයට විශාල වශයෙන් හේතු වූයේ එතැන් විනිමය වෙළෙඳපොළේ ගනුදෙනු පරිමාව ඉහළ යාමය. කෙසේ වෙතත්, විදේශ විනිමය වෙළෙඳපොළේ ඉදිරි ගනුදෙනු පරිමාව 2003 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් දශලක්ෂ 1442 මුළු ගනුදෙනුවලින් සියයට 38 පමණ) සිට 2004 වසරේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 1,026 (මුළු ගනුදෙනුවලින් සියයට 23 පමණ) දක්වා පහත වැටිණි.

වසරේ පළමු කාර්තුවේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 355ක මුළු ගනුදෙනු පරිමාවක් වාර්තා කරමින් 2004 වසර ආරම්භයේදී ක්‍රියාකාරීව පැවති ඉදිරි විනිමය වෙළෙඳපොළ, අවසාන කාර්තුවේදී නැවත එ.ජ.ඩොලර් දශලක්ෂ 232ක ගනුදෙනු ප්‍රමාණයක් දක්වමින් ඉහළ නැගීමට පෙර දෙවන හා තෙවන කාර්තුවලදී පිළිවෙළින් එ.ජ.ඩොලර් දශලක්ෂ 233ක සහ එ.ජ.ඩොලර් දශලක්ෂ 201ක ගනුදෙනු පරිමාවක් වාර්තා කරමින් ක්‍රමයෙන් පහත වැටිණි.

**5.10 රූප සටහන**

**විනිමය අනුපාතිකයන්ගේ වෙනස් වීම්**

**විනිමය අනුපාතිකයන්ගේ වෙනස් වීම 2003 සහ 2004**
**එ.ජ.ඩොලරයට එරෙහි රුපියල් අගය**




**සඵල විනිමය අනුපාත දර්ශක**
**මුදල් වර්ග 24 පැස අනුව (1999=100)**




ඉදිරි විනිමය ගනුදෙනු සම්බන්ධව පරිමාව සහ අධිමිල යන දෙකෙහිම වෙනස්වීම්වලින් පිළිබිඹු වූයේ වසර පුරා පැවති අවිනිශ්චිතතා මට්ටමයි. වසර අවසාන වන විට මාස 1 සහ මාස 3 සඳහා වන වාර්ෂික සාමාන්‍ය ඉදිරි ගනුදෙනු අධිමිල පිළිවෙලින් සියයට 7.86 සහ සියයට 8.33 දක්වා ඉහළ ගියේ එකී කාණ්ඩ දෙක සඳහා පැවති සියයට 4.8ක පොලී අනුපාත අන්තරයද ඉක්මවමිනි. රුපියලේ වේගවත් අවප්‍රමාණයක් හෝ ඉහළ පොලී අනුපාතිකයක් පිළිබඳ වෙළෙඳපොළ අපේක්ෂාවන් පිළිබිඹු කරමින් වසරේ වැඩි කාලයක් මුළුල්ලේ ඉදිරි විනිමය අධිමිල පොලී අනුපාත අන්තරයට වඩා ඉහළින් පැවතුණි.

2003 වසරේදී මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ විනිමය වෙළෙඳපොළේ අතිරේක උච්චාවචනයන් සමනය කිරීම සඳහා විදේශ විනිමය ගනුදෙනු සඳහා මැදිහත්වීම තවදුරටත් සිදු කෙරිණි. 2003 වසරේදී නිල සංචිත ගොඩ නැංවීම සඳහා සිදුකළ විශාල මිලදී ගැනීම්වලට එරෙහිව, 2004 වසරේදී විදේශ විනිමය විකිණීම සඳහා මහ බැංකුව මැදිහත් වූයේ ඉහළ ගිය වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහාය. ඒ අනුව, 2004 වසරේදී මහ බැංකුව එ.ජ.ඩොලර් දශලක්ෂ 541.7ක් වෙළෙඳපොළ තුළ විකුණා, එ.ජ.ඩොලර් දශලක්ෂ 27ක් මිලට ගෙන ඇති අතර, ශුද්ධ විකිණීම ප්‍රමාණය එ.ජ.ඩොලර් දශලක්ෂ 514.7ක් විය.

**5.11 රූප සටහන**

**අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු - 2003 සහ 2004**

